# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

# காணிச் சீர்திருத்த ஆணைக்குழு

# LAND REFORM COMMISSION

# *වාර්ෂික වාර්තාව*

# *ஆண்டறிக்கை*

# *ANNUAL REPORT*

# *2014*

**2014 ජනවාරි 01 සිට 2014 දෙසැම්බර් 31 දක්වා**

2014 ஆம் ஆண்டு சனவரி 01 ஆந் திகதி
தொடக்கம் 2014 ஆம் ஆண்டு திசெம்பர் 31 ஆந்
திகதி வரை

From 1st of January-31 st of December 2014

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ තොරතුරු

| | |
|---|---|
| **ආයතනය** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව |
| **අමාත්‍යාංශය** | ඉඩම් අමාත්‍යාංශය |
| **ලිපිනය** | සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,<br>කොළඹ - 07 |
| **ඊමේල් ලිපිනය** | lrcadmin@sltnet.lk |
| **දුරකථන අංක** | 011-2694251/011-2672273 |
| **ෆැක්ස් අංක** | 011-2693438 /011-2698849 |
| **විගණකවරු** | විගණකාධිපති,<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව,<br>බත්තරමුල්ල |
| **බැංකුකරුවන්** | ලංකා බැංකුව<br>ආයතනික ශාඛාව<br>කොටුව<br><br>ජාතික ඉතිරි කිරීමේ බැංකුව<br>බොරැල්ල<br><br>රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව,<br>කොල්ලුපිටිය |

# සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික රාජ්‍ය සභාවේ අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා දශක හතරකට වැඩි කාලයක් ගෙවී ඇති මේ මොහොතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2014 වසරේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමට ලැබීම විශාල සතුටකි.

කොමිෂන් සභාවේ නිර්මාතෘවර දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් අපේක්ෂා කළ පරිදි සුළුතරයක් අත වූ ලංකාවේ ඉඩම්වල අයිතිය එහි සැබෑ උරුමකරුවන් වූ මේ රටේ මහජනතාව අතර සාධාරණ හා ඵලදායී ලෙසත් මේ රටේ සංවර්ධන කාර්යයට දායක වන ලෙසත් ලබාදීම විවිධ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ඉතාමත් දුෂ්කර හා සංකීර්ණ කාර්යයක්ව තිබූ යුගයක ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නව සභාපති ලෙස මා පත්කරලීමද භාග්‍යයක් කොට සලකමි.

මේ වන විට ලංකාව තුළ ක්‍රියාත්මක ජාතික සංවර්ධන වැඩ පිළිවෙල යටතේ රටේ ජනතාවගේ වටිනාම සම්පත වූ ඉඩම් නිසි ලෙස පරිහරණය කිරීමට රටේ ජනතාවට ඉඩකඩ සැලසී ඇති අතර අද ජාතික සංවර්ධනය සඳහා සෘජු ලෙසම දායකවන්නට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමත්ව සිටී.

2014 වසර ඇතුලත කොමිෂම අරමුණු කළ කාර්යයන්ගෙන් 80% කට ආසන්න ප්‍රමාණයක් නිම කිරීමට හැකියාව ලැබී ඇති අතර ඉඩම් ඔප්පු 3500 කට ආසන්න ප්‍රමාණයක් ජනතා අයිතියට පැවරීම, කොමිෂමේ දිස්ත්‍රික් කාර්යාල හුදෙක් ඉටු කළ කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා යෙදවීමේ සැළසුම අනුව දිස්ත්‍රික් 4 ක ව්‍යාපෘති ඇරඹීම හා අනෙකුත් දිස්ත්‍රික්කයන්හි  නව ව්‍යාපෘති අවස්ථා හඳුනා ගැනීම, සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභ සාධනය නැංවීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම, කොමිෂන් සභාවේ ඉඩම් ලේඛණය කොළඹ විශ්ව විද්‍යාල අධීක්ෂණය යටතේ පරිගණක ගත කිරීම ආරම්භ කිරීම වැනි වැදගත් කාර්යයන් රැසක් මේ වසර තුල ඉටු කිරීමට හැකියාව ලැබී ඇත.

මේ වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඉඩම් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ සිය කාර්යයන් ක්‍රියාත්මක කර ඇති අතර ගරු ඉඩම් අමාත්‍යතුමා සහ අමාත්‍යාංශ ලේකම්තුමා කොමිෂන් සභාවේ කටයුතු කෙරේ දක්වන උනන්දුව හා සහයෝගයද සිහිපත් කරන අතර ළඟා කර ගෙන ඇති සාර්ථකත්වයට සහාය වන විධායක අධ්‍යක්ෂ ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයට ස්තුතිය පුද කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල
සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන්  සභාව

# විධායක අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2014 වසරේ ප්‍රගතිය සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා හැටියට මම ඉමහත් සතුටට පත්වෙමි.

හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් සමග එක්ව 1972 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දේශයට දායාද කරන්නට දායක වූ යුග පුරුෂයන් අතර ද සිටි ගරු ඉඩම් අමාත්‍යතුමා අද එහි අධීක්ෂණය හා මග පෙන්වීම සිදු කරන නියමුවානන් බවට පත්ව සිටී.

2014 වසර හා සළකා බලන විට පෙර වර්ෂයන්ට සාපේක්ෂව කොමිෂන් සභාව මෙරට ජාතික ආර්ථික දේහය තුල වඩ වඩාත් කැපී පෙනෙන ආයතනයක් බවට පත්ව තිබීම අප සැමගේ සතුටට හේතුවකි.

කොමිෂන් සභාව සතු ඉඩම් විවිධ සංවර්ධන කාර්යයන් සඳහා ද ව්‍යාපෘතීන් සඳහා ද යෙදවීමේදී ගරු සභාපතිතුමන්ට සෘජුවම මග පෙන්වමින් ගරු අමාත්‍යතුමන් තම ඓතිහාසික කාර්යය භාරයේ වගකීම අතික්‍රමණය කිරීමට ලැබීමද අප ලැබූ ජයග්‍රහනයේ පදනම බවද කිව හැකිය.

වර්තමාන ශ්‍රී ලංකාව ලැබූ නව දේශපාලන ගමන් මගේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් විධිමත්ව හා ඵලදායී ලෙස එම අරමුණු සඳහා යොදවන්නට කොමිෂන් සභාව 2014 වසර තුල සිදු කළ කටයුතු බොහොමයක් සාර්ථක වූ බවද සඳහන් කරමි.

වර්තමානයේදී ඉඩම් අමාත්‍යාංශ විෂය පථයට ඇතුලත්ව ඇති අතර ගරු ඉඩම් අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමාගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු වන බැවින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියළු කටයුතු හා කාර්යයන් ඉතාමත් ප්‍රශස්ත මට්ටමකට ගෙන එන්නට ද ඉදිරියේදී හැකියාව ලැබෙනු ඇතැතයි මම විශ්වාස කරමි.

කොමිෂන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේලා එහි නියමුවානන් ලෙස කටයුතු කරනු ලබන වර්තමාන සභාපතිතුමන් වෙත මාගේ ද උපරිම දායකත්වය ලබා දෙනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියළු නිලධාරින් එම කාර්යයන්හි හිමිකරුවන් ලෙස ලබාදෙන්නා වූ සහාය සම්බන්යෙන් මාගේ ගෞරවයට ලක් කරමි.

නීතිඥ අයි. එම්. අබේරත්න
විධායක අධ්‍යක්ෂ
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

# bvï m;ixi lrK fldñIk iNdj
## jd¾Il jd¾;dj ) 2014

mgqk mgqwxl


1' ye|kùu 01

2' bvï m;ixi lrK fldñIk iNdfõ ld¾h uKv,h 14

3' ixúOdk ie,eiu 16

4' ld¾h idOkh 17

5' wjik .Kqï jd¾;dj 43

6' ú.K ldêm; jd¾;dj 46

7' ú.K ldêm; jd¾;djg m<;r 59

8' ú.Kk yd l<uKdlrK lñgqj jd¾;dj 81

# හැඳින්වීම

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට 1972 දක්වා විහිදී යන ඉතිහාසයක් ඇත.

අවුරුදු 35 ක් පුරා කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මෙන්ම රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙය වන ලදි. ඉඩම්හිමියන්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම, පවරාගත් ඉඩම් ඵලදායි ආයෝජන වලට යෙදවීම, කොමිෂන් සභාවට ලැබිය යුතු ආදායම රැස්කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම, සේවක මණ්ඩල පුහුණුව සහ සුභසාධනය ප්‍රධාන ප්‍රමුඛතාවයන් වේ.

වර්තමාන ශ්‍රී ලංකාවේ පෙරළිකාර දේශපාලන ගමන් මග සාර්ථක කරමින් දින 100 ප්‍රතිපත්තිවලට අනුව ඉඩම් කැබලි වැඩි ප්‍රමාණයක් මහජනයා අතරේ බෙදාදීමේ වැඩපිළිවෙළ යටතේ එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිෂන් සභාවේ කටයුතු මෙහෙවීමට කටයුතු සම්පාදනය කර ඇත.

තවද, මෙම වසර තුළ ආයතනයේ සේවක සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිතභාවයක් ඇති කරමින් නව ජීවයක් ලබාදීමේ වැඩසටහනක් දියත් කිරීම ආරම්භ කිරීමටද කටයුතු සම්පාදනය වෙමින් පවතී.

2014 වසර තුළ පහත සඳහන් ප්‍රමුඛතාවයන් විශේෂයෙන්ම හඳුනා ගැනීමට කටයුතු කර ඇත.

i. කොමිෂන් සභාව සතු හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම.

ii. ඵලදායි නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම.

iii. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ වැඩපිළිවෙළ යටතේ කොමිෂන් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදාදීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා තිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කර තිබූ වැඩසටහනට නව මුහුණුවරක්දී ජාතික කර්තව්‍යයක් ලෙස ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරවීම.

iv. ආදායම් වැඩිකිරීමේ වැඩසටහන.

(අ) රණවිරු සේවා අධිකාරිය

(ආ) රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම.

(ඇ) රාජ්‍ය ආයතවලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම.

(ඈ) බදු පදනම මත පුද්ගලයින්ට පවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම.

(උ) කළුගල් බැදීම හා ඊට අදාළ ආදායම් රැස්කිරීම.

(ඌ) මැණික් ඉඩම්වලට අදාළව නව රෙගුලාසි පනවා ආදායම් රැස්කිරීම.

(එ) සිලිකා, ඩොලමයිට් වැලි ආදී ඛනිජ ද්‍රව්‍ය ඇති ඉඩම්වලින් ආදායම් ලබා ගැනීම.

ආයතනයේ මෙම කාර්යභාරය පිළිබඳ කාර්යමණ්ඩලය දැනුවත් කිරීම හා නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ආයතනයේ සියලුම නිලධාරීන්ගෙන් සමන්විත එක් එක් කාර්යයන් සඳහා කමිටු පත්කිරීම හා වැඩමුළු පැවැත්වීමද ආරම්භ කරන ලදි. එමෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදි.

රජයේ ප්‍රතිපත්ති වලට අදාලව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යභාරය මෙහෙයවීමට හා කඩිනමින් ක්‍රියාත්මක කරවීම ඉතා කාලෝචිත පියවරක් ලෙස සලකා නිරතුරුවම සාකච්ඡා පවත්වා අවශ්‍ය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු, පසු විපරම් කිරීමද සිදුව ඇත. තවද, මහජනයාගේ විවිධ ගැටලු සම්බන්ධයෙන් ඔවුන් කැඳවා පත්කළ කමිටු මගින් ඍජු සාකච්ඡාවන් පවත්වා කඩිනම් තීරණ ගැනීමද සිදු වී ඇත.

මීට අමතරව ඵලදායි ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම ඇති උපදේශක කමිටුවේ නිර්දේශය මත ක්‍රියා කිරීම ආරම්භ කිරීමටද කටයුතු කර ඇත.

තවද, ගරු ඉඩම් අමාත්‍යතුමන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ කඩිනම් මෙහෙයවීම, උපදෙස් සහ මගපෙන්වීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් පවරා ගත් ඉඩම් අතුරෙන් ගිලිහී ගොස් ඇති සම්පත්වලින් ආයතනයේ ප්‍රගතිය පමණක් නොව රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීමටද කටයුතු කර ඇත.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරිමයට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා ඵලදායීතාවය ඉහළ නංවමින්ද හෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින්ද ඉඩම් උපරිමය කාලානුරූපව බලාත්මක කරමින්ද නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතුවල ආයෝජනය කරමින්ද අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කළ හැකි ඉඩම් සංචිතයක් පවත්වාගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායකවීම.

# අරමුණු

01. ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම

i. ප්‍රකාශිත එහෙත් හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම.
ii. මහජනතාව වෙතින් ලැබෙන තොරතුරු අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනා ගැනීම.
iii. පැවරීම් කළද එම කාර්යය ඉටු නොවන්නේ නම්, එම ඉඩම් කොමිෂන් සභාව සතු කර ගැනීම.

02. කොමිෂන් සභාව වෙත පැවරුණු ඉඩම් පිළිබඳ

i. ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නිශ්චය හා නීතිමය බැඳීම් නිදහස් කිරීම.
ii. උපරිමයට වැඩි ඉඩම් කොමිෂන් සභාව වෙත පවරා ගැනීම.
iii. පවරාගත් ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීම.
iv. ප්‍රකාශ කරන ලද එහෙත් ප්‍රකාශ නොවන අයගේ ඉඩම් ආපසු ලබාදීම යන කාර්යයන් කිරීම

03. රටේ ආර්ථිකය සමාජ සංවර්ධනය උදෙසා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා පනතේ ප්‍රතිපාදන අනුව පවරා ගනු ලැබූ ඉඩම් ඵලදායී ලෙස ආයෝජන කාර්යයන්හි යෙදවීම.

04. කොමිෂන් සභාව සතු ඉඩම්වලින් ලැබිය යුතු ආදායම් රැස් කිරීම හා එයින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය ලබාදීම.

# කාර්යයන්

- ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම.
- උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිෂන් සභාව සතු කර ගැනීම.
- පනත්වලින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නීතිමය බැඳීම් නිදහස් කිරීම.
- කොමිෂන් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.
- පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.
- ඉඩම් ලේඛණ යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම.
    1. ප්‍රකාශ කර ඇති නමුත් හඳුනාගෙන නොමැති ඉඩම්
    2. උපරිමයට වැඩි ප්‍රකාශ නොකරන ලද ඉඩම්
    3. පවරාදි ඇති නමුත් ඵලදායී ආයෝජනයක් නොකරන ලද ඉඩම්
- රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.
    1. ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.
    2. කෘෂිකාර්මික ව්‍යාපෘති සහ වගා කටයුතු සඳහා ඉඩම් ලබාදීම.
    3. කර්මාන්ත සඳහා ඉඩම් ලබාදීම.
- රටේ සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම
    1. ඉඩම් නොමැති ජනතාවට නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම.
    2. රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ගනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.
    3. ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් ලබාදීම
    4. ජනතාව වෙනුවෙන් පොදු කටයුතු සඳහා ඉඩම් ලබාදීම.
    5. රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉඩම් ලබාදීම.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

❖ ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

i භූමියේ ඇති සම්පත්වලින් ආදායම් රැස් කිරීම.

ii බදු පදනම මත ඉඩම් පැවරුම් කර බදු ආදායම් රැස් කිරීම සහ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, හා පුද්ගලයින්ගේ ලැබිය යුතු මුදල් අය කර ගැනීම.

❖ ආයතනයේ සංවිධාන ව්‍යුහය ව්‍යුහගත කිරීම

i. පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම.

ii. විධිමත් රාජකාරී පැවරුමක් කිරීම.

iii. බලතල විමධ්‍යගත කරමින් රාජකාරී පැවරුමක් කිරීම.

iv. සාකච්ඡා, වැඩමුළු, පුහුණුවීම් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.

❖ ආයතනයේ කාර්යයන් කාර්යක්ෂම හා ඵලදායීව ඉටු කිරීම සඳහා භෞතික සම්පත් සම්පාදනය හා අවශ්‍ය පහසුකම් සලසාදීම.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## කාර්යභාරය

පනතේ විධිවිධානයන්ට අනුව පැවරී ඇති කාර්යභාරයට අමතරව වරින්වර රජයන් මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව කොමිෂන් සභාවේ මෙම කාර්යභාරය පුළුල් විෂයයක් තුළ ක්‍රියාවට නැංවේ.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

1. **1972** අංක **1** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත
2. **1975** අංක **39** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
3. **1981** අංක **14** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
4. **1981** අංක **39** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
5. **1986** අංක **14** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ ( විශේෂ විධිවිධාන ) පනත
6. **1986** අංක **18** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත

අංක (1) හා (2) පනත් අනුව

I. දේශීය ප්‍රකාශකයින්ගෙන් - අක්කර **563"449**
II. රත් පවුම් සමාගම්වලින් - අක්කර **195"644**
III. රුපියල් සමාගම්වලින් - අක්කර **228"813**

වශයෙන් අක්කර **987"906** ක් ඉඩම් ප්‍රතිසංසක්රණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක **1** හා **2** පනත් සම්බන්ධව

I. සංශෝධනයන් - අංක **3** හා **6** පනත් වලින්ද
II. විධිවිධානයන් - අංක 4, **5** හා **6** පනත් වලින්ද සලසා ඇත.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංයුතිය මෙසේය.

1. ගරු විෂයභාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන -සභාපතිතුමා
2. ගරු විෂයභාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් -05
3. නිල බලයෙන් පත්වන සාමාජිකයින් -03

කොමිෂන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේලා උපයෝගී කරගනු ලබනුයේ මෙම කොමිෂන් සභා මණ්ඩලය මගින් ගනු ලබන තීරණ හා අනුමැතියන් වන අතර, එක් එක් කාර්යයට කොමිෂන් සභා මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2014.12.31 දින දක්වා කොමිෂන් සභා මණ්ඩල රැස්වීම් 663 ක් පවත්වා ඇත.

## පනතේ 45 (1) අ වගන්තිය යටතේ පත් කරන ලද සභාපති

| අනු අංකය | නම | නිත්‍ය තනතුර | පත් වූ දිනය හා සාමාජිකත්වය දැරූ කාල සීමාව | කාර්යාලයීය ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 1. | නීතිඥ නිමල් ජී. පුංචිහේවා මහතා | සභාපති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2008.03.12 සිට 2014.12.31 දින මේ දක්වා | සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 | 011- 2698798 |

## පනතේ 45 (1) ආ වගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයින්

| අනු අංකය | නම | නිත්‍ය තනතුර | පත් වූ දිනය හා සාමාජිකත්වය දැරූ කාල සීමාව | කාර්යාලයීය ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 1. | නීතිඥ හරිගුප්ත රෝහණධීර මහතා | විධායක අධ්‍යක්ෂ | 2008.06.04 සිට 2014.12.31 දින දක්වා | සී 82 හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 | 011-2693967 |
| 2. | එම්.අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ | 2012.11.23 දින සිට 2014.12.31 දින දක්වා | ජාතික අයවැය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය, කොළඹ 01. | 011-2484500 |
| | එස්.ආර්.ඩබ්.එම්.පී සත්කුමාර මහතා | අධ්‍යක්ෂ | 2012.11.23 දින සිට 2014.12.31 දින දක්වා | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 071-5320029 |
| 3. | යූ.කේ.එස්. මිහිඳුකුලසූරිය මහතා | අතිරේක ලේකම් | 2013.09.01 සිට 2014.08.25 දින මේ දක්වා | වැවිලි කර්මාන්ත අමාත්‍යංශය, 55/75, වොක්ස්හෝල් පටුමග, කොළඹ 02 | 011-2438707 |
| | එම්. ඒ. එල්. එස්. එන්. කේ. මන්ත්‍රීනායක මහතා | අතිරේක ලේකම් | 2014.09.23 දින සිට 2014.12.31 දින දක්වා | | |
| 4. | පී.ඩබ්. සේනාරත්න මහතා | උපදේශක | 2007.01.01 දින සිට 2014.12.31 දින දක්වා | මිලෝදා ආයතනය, ඕල්කට් මාවත, කොළඹ - 11 | 071-4450080 |

## පනතේ 45 (1) ඇ වගන්තිය යටතේ නිල බලයෙන් පත්වන සාමාජිකයින්

| අනු අංකය | නම | නිත්‍ය තනතුර | පත් වූ දිනය හා සාමාජිකත්වය දැරූ කාල සීමාව | කාර්යාලයීය ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 1. | ආර්.පී.ආර්. රාජපක්ෂ මයා | ඉඩම් කොමසාරිස් ජනරාල් | 2010.08.19 දින සිට මේ දක්වා | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල | 011-2866172 |
| 2. | එම්.ජ්.එස්. වීරසිංහ මහතා | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | 2012.05.24 දින සිට මේ දක්වා | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 | 011 -2672712 |
| 3. | කේ.ජී. ශ්‍රියාපාල මහතා | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්. | 2012.06.25 දින සිට මේ දක්වා | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නොරුව, පේරාදෙණිය. | 081-2388331 |

# භෞතික සම්පත් කළමනාකරණය

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුළ සිදු වූ වෙනස්කම් | | වසර අවසානයේ පැවති තත්වය |
|---|---|---|---|---|---|
| | | | විකිණීම් | මිලදී ගැනීම් | |
| 1. | කැබ් රථ | 13 | 02 | 01 | 12 |
| 2. | මෝටර් රථ | 01 | | 01 | 02 |
| 3. | මයික්‍රො කයිරන් ජීප් රථ | 02 | | | 02 |
| 4. | වෑන් | 01 | 01 | 01 | 01 |
| 5. | මෝටර් සයිකල් | 01 | 01 | | - |
| 6. | ඩුප්ලෝ යන්ත්‍ර | 01 | | | 01 |
| 7. | ඡායා පිටපත් යන්ත්‍ර | 06 | | | 06 |
| 8. | පරිගණක | 41 | | 06 | 47 |
| 9. | පරිගණක ප්‍රින්ටර්ස් | 31 | | | 31 |
| 10. | ලැප්ටොප් පරිගණක | 01 | | | 01 |
| 11. | ෆැක්ස් යන්ත්‍ර | 20 | | | 20 |
| 12. | යතුරු ලියන | 03 | | | 03 |
| 13. | සේප්පු | 10 | | | 10 |
| 14. | කැමරා | 01 | | | 01 |
| 15. | රූපවාහිනී යන්ත්‍ර | 01 | | | 01 |
| 16. | ශීතකරණ | 01 | | 01 | 02 |
| 17. | රෝනියෝ යන්ත්‍ර | 02 | | | 02 |
| 18. | ශබ්ද විකාශන යන්ත්‍ර | 01 | | | 01 |

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය


ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම ඉදිරි දැක්ම ලෙස පෙරටු කරගනිමින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සභාපති කටයුතු කරන අතර, සභාපතිගේ සහාය සඳහා විධායක අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජනරාල් අංශභාර අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යක්ෂවරුන් ඇතුළු සියලු කාර්යමණ්ඩලය **370** දෙනෙකුගෙන් සමන්විතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කරනු ලබයි.

එකී කාර්යමණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ අංශ 14 ක් හා දිස්ත්‍රික් කාර්යාල **20** ක් වශයෙන්ද බෙදා වෙන් කර ඇත.

## 2014.12.31 දක්වා කාර්යමණ්ඩල සංයුතිය

| අනු අංකය | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | - | 01 |
| 2 | අධ්‍යක්ෂ පාලන/ලේකම් | 01 | 01 | - |
| 3 | අධ්‍යක්ෂ මුදල් | 01 | 01 | - |
| 4 | අධ්‍යක්ෂ/නීති | 01 | - | 01 |
| 5 | අධ්‍යක්ෂ/ඉඩම් | 01 | 01 | - |
| | අධ්‍යක්ෂ/ මැණුම් ( කොන්ත්‍රාත්) | - | 01 | - |
| 8 | සහකාර අධ්‍යක්ෂ (පාලන) | 01 | 01 | - |
| 9 | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 02 | 03 | - |
| 10 | සහකාර අධ්‍යක්ෂ (නීති) | 03 | 04 | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) | 01 | 01 | - |
| 12 | සහකාර අධ්‍යක්ෂ (පළාත්) | 20 | 20 | - |
| 13 | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති කෘෂි සංවර්ධන ) | 01 | 01 | - |
| 14 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් උපරිම සීමා ) | 01 | 01 | - |
| 15 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පැවරීම් ) | 01 | 01 | - |
| 16 | සහකාර අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි ) | 01 | - | 01 |
| 17 | සහකාර අධ්‍යක්ෂ (මැණුම් ) | 01 | - | 01 |
| 18 | අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| 21 | පුද්ගලික සහකාර iv | - | 01 | - |
| 23 | ගිණුම් නිලධාරි | 01 | - | 01 |
| 24 | පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| 25 | තොරතුරු තාක්ෂණ නිලධාරි | 01 | 01 | - |
| 26 | තක්සේරු නිලධාරි | 01 | - | 01 |
| 27 | තක්සේරු පරීක්ෂක | 03 | - | 03 |
| 28 | මාණ්ඩලික සහකාර v | - | 23 | - |
| 29 | ගිණුම් නිලධාරි v | - | 05 | - |
| 30 | සැලසුම් ශිල්පී | 02 | - | 02 |
| 31 | ප්‍රවාහන සහකාර | 01 | 01 | - |
| 32 | කළමණාකාර සහකාර | 215 | 241 | - |
| 33 | රියදුරු | 17 | 17 | - |
| 34 | කාර්යාල කම්කරු | 44 | 43 | - |
| | | **354** | **370** | **11** |

# සංවිධාන සැලැස්ම


ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
සභාපති
විධායක අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ ජනරාල්
L-1
L-2
අධ්‍යක්ෂ පාලන/ලේකම්
අධ්‍යක්ෂ/මුදල්
අධ්‍යක්ෂ නීති
අධ්‍යක්ෂ ඉඩම්
L-3
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ පාලන
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ආදායම් මුදල්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ගිණුම්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ නීති
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ විමර්ශන
සහකාර අධ්‍යක්ෂ පාලන
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ව්‍යාපෘති කෘෂි සංවර්ධන
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ඉඩම් උපරිම සීමා
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ඉඩම් පැවරීම්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ මැණුම්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක
L-4
පරිපාලන නිලධාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි
ගිණුම් නිලධාරි
තක්සේරු පරීක්ෂක
තක්සේරු නිලධාරි
L-5
L-6
කළමනාකරණ සහකාර
ප්‍රවාහන නිලධාරි
කළමනාකරණ සහකාර පොත් තබන්නා
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
සැලසුම් ශිල්පි
L-7
රියදුරු
L-8
කාර්යාල කාර්ය සහායක
L -9
සනීපාරක්ෂක

## කාර්ය සාධනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ එක් එක් අංශයන් මගින් ඉටුකරනු ලබන කාර්යයන් හා 2014 ජනවාරි 01 වන දින සිට 2014 දෙසැම්බර් 31 දක්වා ඉටුකර ඇති කාර්යයන් සම්බන්ධයෙන් වූ ප්‍රගතිය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පහත සඳහන් වේ.

**1. සභාපති අංශය සහ විධායක අධ්‍යක්ෂ අංශය**

**කාර්යයන් :-**

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලු කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතීන් සහ උපදෙස් ලබාදීම.

ii. කාර්යාලයට පැමිණෙන මහජනයාගේ ගැටලු විසඳාලීමට අවශ්‍ය උපරිම කටයුතු කිරීම.

iii අමාත්‍යාංශය හා සහ සම්බන්ධවෙමින් ආයතනයේ කටයුතු විධිමත් කිරීම.

iv. අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අමාත්‍යවරුන් සමග සම්බන්ධීකරණයවීම.

## 02 . කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය

**කාර්යයන්**

i. ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශයන් මගින් ඉදිරිපත් කරනු ලබන කොම්පන් සභා පත්‍රිකාවන් පරීක්ෂා කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.
ii. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා ඒවා අදාළ අංශයන් වෙත යොමු කිරීම.
iii. ව්‍යාපෘති කමිටු රැස්කිරීම හා ඊට අදාළ වාර්තා තබා ගැනීම.
iv. ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පන් සභාවේ සියලුම නිලධාරීන්ට අදාළ වන සියලුම පරිපාලන කටයුතු.
v. සේවක බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම් සහ වැටුප් වර්ධක ලබාදීම, සේවක පරිපාලනය සම්බන්ධ කටයුතු.
vi. දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණ කටයුතු හා අධීක්ෂණ කටයුතු කිරීම
vii. නිලධාරීන්ට අදාළ සුභ සාධක කටයුතු ඉටු කිරීම.
viii. කාර්යාල අවශ්‍යතා සපුරාලීම.
ix. එදිනෙදා කාර්යාල නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.
x. ප්‍රසම්පාදන කටයුතු පවත්වාගෙන යාම.
xi. මහජන දිනය පවත්වාගෙන යාම.
xii. ආයතනයේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාත්මක සැලැස්ම, වාර්ෂික වාර්තා සහ අනෙකුත් වාර්තා පිළියෙල කිරීම.
xiii. චක්‍රලේඛ නිකුත් කිරීම.
xiv. විශ්‍රාම ගැන්වූ සහ ඉල්ලා අස්වූ නිලධාරීන් සඳහා පාරිතෝෂික දීමනා, සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් නිදහස් කිරීමට අදාළ කටයුතු කිරීම.
xv. පොදු උත්සව සංවිධානය කිරීම.
xvi. පොදු වාහන කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යාම.
xvii. ආයතනයේ කාර්යමණ්ඩල විනය කටයුතු පවත්වාගෙන යාම.
xviii. විගණන වාර්තා පවත්වාගෙන යාම සහ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ ගිණුම් කාරක සභාව වෙත අවශ්‍ය තොරතුරු වාර්තා ඉදිරිපත් කිරීම.
xix. වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත හා පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම.

**2014 .01.01 දින සිට 2014.12.31 දින දක්වා ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්**

1. 1994 වර්ෂය දක්වාම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සමස්ත සේවක සංඛ්‍යාව ලෙස විධිමත් අනුමැතිය ලැබී තිබුයේ 190 ක් වූ සේවක සංඛ්‍යාවකට පමණි. සමස්ත සේවක සංඛ්‍යාවේ රැකියා සුරක්ෂිතභාවය ඇති කිරීම පිණිස වසර ගණනාවක් තුළ ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස සමස්ත සේවක සංඛ්‍යාව 354 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට හැකියාව ලැබුණි.

2. කාර්යාල කටයුතු සඳහා අදියර දෙකක් තුළදී පරිගණක යන්ත්‍ර ලබාදීමට කටයුතු කරන ලදී. එදිනෙදා රාජකාරි සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ ලබා නොදුන් කාර්යාල කිහිපයක් සඳහා ද අවශ්‍ය කාර්යාල උපකරණ ලබාදීමට කටයුතු කර ඇත.

3. දිස්ත්‍රික් රාජකාරි කටයුතු කඩිනම් කිරීම උදෙසා සහ ආදායම් වර්ධනය කිරීම උදෙසා දින 14 ක් බැගින් වන සේ රාජකාරි වාහන පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.

4. දිස්ත්‍රික් රාජකාරි කටයුතු කඩිනම් කිරීම උදෙසා සහ ආදායම් වර්ධනය කිරීම උදෙසා මහනුවර, කුරුණෑගල, පුත්තලම, ගාල්ල/මාතර යන දිස්ත්‍රික් කාර්යාල හතරට ස්ථිර පදනම මත රාජකාරි වාහන පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත. මෙමගින් ආදායම් තත්වය වැඩි කර ගැනීම ඉලක්ක කර ඇති අතර වාහනයේ මාසික කල්බදු මුදලද අදාළ දිස්ත්‍රික් කාර්යාලය විසින් ගෙවීම් කරනු ලැබේ.

5. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ආදායම් ඉලක්ක, සපුරාලීමට දායකත්වයක් ලබාදීම දිස්ත්‍රික් කාර්යාල වෙතින් සිදු කෙරෙනු ඇත. එකී ආදායම් තත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සෑම දිස්ත්‍රික්කයකම කොමිෂන් සභාව මගින් පවත්වාගෙන යා හැකි වන ව්‍යාපෘතියක් ආරම්භ කරමින් පුත්තලම දවුල් කුරුඳුවත්ත පොල් වගා ව්‍යාපෘතියක් සහ නුවරඑළිය ලිඳුල බංගලාව සංචාරක නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන යාමටත් මේ වනවිටත් කටයුතු ආරම්භ කර ඇත.

6. 1972 වර්ෂයේ ආරම්භ කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය මේ දක්වාම හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 හි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් සී 81 හා සී 82 දරන ගොඩනැගිලිවල ස්ථාපිත කර ඇත. මෙම ගොඩනැගිලි බදුකුලී තක්සේරු මුදල් අතීතයට බලපාන සේ වැඩිකරලීම හේතුවෙන් කුලී මුදල් ගෙවීම් කිරීම පිළිබඳව ඇති වූ ගැටලුව සම්බන්ධයෙන් සාකච්ඡා වාර කිහිපයක් අදාළ පාර්ශවයන් සමග පවත්වන ලදී.

7. දිවයිනේ සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි ඉඩම් නොමැති පවුල් සඳහා ඉඩම් ඔප්පු ලබාදීමේ ඔප්පු ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.

8. ජනවාරි මස 01 වන දින කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් නව අවුරුද්ද සැමරීම නිමිත්තෙන් කෙටි උත්සවයක් සංවිධානය කිරීම.

9. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිත්තෙන් අප්‍රේල් 22 වන දින කාර්යමණ්ඩලයේ සහභාගිත්වයෙන් අලුත් අවුරුදු උත්සවයක් පැවැත්වීම.

10. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිර්මාතෘ දිවංගත ගරු හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතානන්ගේ 31 වන ගුණසමරු උත්සවය අළලා සංඝගත දානමය පුණ්‍යකර්මයක් කාර්යමණ්ඩලයේ සහභාගිත්වයෙන් සැප්තැම්බර් මස 25, 26, 27 යන දිනයන් තුළ මහනුවර බෝගම්බර බෝමළුව රජමහා විහාරයේදී පවත්වන ලදී.

11. එමෙන්ම කාර්යමණ්ඩලයේ සාමුහික හැගීම් වර්ධනය කිරීම උදෙසා දෙසැම්බර් මස 26 වන දින වාද්දුව පිපමන්විලා උත්සව ශාලාවේ සුහද හමුවක් සහ කාර්ය මණ්ඩලය සඳහා දිවා භෝජන සංග්‍රහයක් උත්සවශ්‍රීයෙන් සංවිධානය කරන ලදී.

12. සේවාලාභින්ගේ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ක්‍රමවේදය, ඉඩම් ගැටලු නිරවුල් කිරීම, ගැටලු හඳුනා ගැනීම, සාකච්ඡා කිරීම, සහ පැමිණිලි විමර්ශනය කිරීම, සඳහා ප්‍රධාන කාර්යාලයේ සෑම බදාදා දිනයකම පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා මහජන දිනයක් පැවැත්වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි දිනකට 200 - 300 අතර සංඛ්‍යාවක සේවාලාභීන් සහභාගී වන අතර. සභාපති, විධායක අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු අංශභාර අධ්‍යක්ෂවරු හමුවේ තම ගැටලුව ඉදිරිපත්කර සහනයක් ලබා ගැනීමට මහජනතාවට ඉඩකඩ සලසා ඇත. දිස්ත්‍රික් කාර්යාලවල මහජන දින සඳුදා සහ බදාදා ලෙස දින දෙකක් පවත්වනු ලැබේ.

**<u>පුහුණු සහ වැඩ මුළු සඳහා යොමු කිරීම.</u>**

1. 2014.02.21 සිට සිකුරාදා දින 10 ක් ඉදිකිරීම් යන්ත්‍රෝපකරන මධ්‍යස්ථානය මගින් මෙහෙය වූ ගබඩාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවට ලේඛණාගාරයේ නිලධාරිනිය යොමු කරවීය.
2. 2014.07.03 සහ 04 දෙදින සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් සහ එයට සමගාමීව ශ්‍රී ලංකා තේ මණ්ඩල ශ්‍රවණාගාරයේදී වැඩමුළුවක් පවත්වන ලදී.
3. නඩු කටයුතු ඉටු කරනු ලබන කොමිෂන් සභාවේ සියළුම නිලධාරින් සඳහා 2014.08.22 දින පුහුණු වැඩමුළුවක් පැවැත්විය.
4. ක්ෂේත්‍ර නිලධාරින් සඳහා 2014.09.12 දින පුහුණු වැඩමුළුවක් පැවැත්විය.

5. **2014.09.18** වන දින පැවැති ඉදි කිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය මගින් මෙහෙය වූ පරිපාලන විධික්‍රම හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනට නිලධාරියකු සහභාගිකරවිය.

6. නිලධාරීන්ගේ කාර්යකක්ෂමතාවය ඉහළ නැංවීම උදෙසා ගිණුම් කටයුතු ඉටු කරනු ලබන සියළුම නිලධාරීන් සඳහා **2014.09.19** දින පුහුණු වැඩමුළුවක් පැවැත්විය.

7. **2014.10.03** දින රත්නපුර ගාල්ල, මාතර, හා හම්බන්තොට දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්විය.

8. **2014.11.17** සහ **18** දෙදින තුල නිපුනතා සංවර්ධන අරමුදල මගින් මෙහෙය වූ ගිණුම් පොත්පත් ක්‍රමාණුකූලව නඩත්තු කිරීම සම්බන්ධ පුහුණු පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී කරවිය.

9. **2014.11.29** දින සිට නිලධාරීන් **20** දෙනෙකු නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පුහුණු කිරීම් සංවර්ධන පදනම මගින් මෙහෙය වූ පරිගණක පාඨමාලාවට සහභාගී කරවිය.

## දිස්ත්‍රික් කාර්යාල

**2014** දෙසැම්බර් මස වන විට දිස්ත්‍රික් කාර්යාල **20** ක් සේ පවත්වාගෙන යාමට කටයුතු කර ගෙන යනු ලබයි.

සමස්ත ශ්‍රී ලංකාව තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇති අතර එකී ස්ථාපනය කරන ලද දිස්ත්‍රික් කාර්යාල ලිපිනයන් පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 01 | <u>කථතර</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>220, පරණ පාර<br>කථතර.<br>දූරකථනය: 034-2223611 | 11 | <u>කෑගල්ල</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>කෑගල්ල.<br>දූරකථනය: 035-2222664 |
| 02 | <u>ගාල්ල</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>මහ නගර ශාලා ගොඩනැගිල්ල<br>ගාල්ල.<br>දූරකථනය: 091 ජ 2243930 | 12 | <u>අම්පාර</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>අම්පාර.<br>දූරකථනය: 063 - 2224021 |
| 03 | <u>මාතලේ</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>මාතලේ.<br>දූරකථනය: 066-2232357 | 13 | <u>මඩකලපුව</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>මඩකලපුව.<br>දූරකථනය: 065-2222986 |
| 04 | <u>මාතර</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>24, සම්බෝධි මාවත<br>පල්ලේමුල්ල<br>මාතර.<br>දූරකථනය: 041-22220 | 14 | <u>රත්නපුරය</u><br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල<br>නවනගරය<br>රත්නපුර.<br>දූරකථනය: 045-2222492 |

| | | | |
|---|---|---|---|
| 05 | මොනරාගල<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>ජනසවි ගොඩනැගිල්ල<br>කච්චේරි හන්දිය<br>මොනරාගල.<br>දුරකථනය: 055-2277208 | 15 | ඇඹිලිපිටිය<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>අංක 12 බී. තොග ගබඩාව පාර<br>නව නගරය<br>ඇඹිලිපිටිය.<br>දුරකථනය: 047-2261801 |
| 06 | මහනුවර<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>4 වන මහල. නව මහ ලේකම් කාර්යාලය<br>මහනුවර<br>දුරකථනය: 081-2222316 | 16 | මාදම්පේ<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>සේනානායක ආරණ්‍ය ඉදිරිපිට<br>පැරණි නගරය මාදම්පේ<br>දුරකථනය: 032-2247183 |
| 07 | ගම්පහ<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ගොඩනැගිල්ල<br>කච්චේරි සංකීර්ණය<br>ගම්පහ<br>දුරකථනය: 033-2230134 | 17 | අනුරාධපුර<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>කච්චේරි සංකීර්ණය<br>අනුරාධපුරය<br>දුරකථනය: 025-2225890 |
| 08 | කොළඹ<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>සෙන්ට්‍රල් ෆාමසි ගොඩනැගිල්ල<br>පාදුක්ක.<br>දුරකථනය: 011-3154787 | 18 | කුරුණෑගල<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>16. උතුරු වැව පාර<br>කුරුණෑගල<br>දුරකථනය: 037-2222553 |
| 09 | බදුල්ල<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>10/1 ඒ. උද්භිද උද්‍යාන පාර<br>බදුල්ල.<br>දුරකථනය: 055-2222308 | 19 | නුවරඑළිය<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>අයි.ආර්.ඩී.බී ගොඩනැගිල්ල<br>උඩුපුස්සැල්ලාව පාර<br>නුවරඑළිය.<br>දුරකථනය: 052-2235385 |
| 10 | හම්බන්තොට<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය<br>තංගල්ල<br>දුරකථනය: 047-2241766 | 20 | යාපනය<br>අධ්‍යක්ප<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>යාපනය<br>දුරකථනය: 021-2219326 |

## දිස්ත්‍රික් කාර්යාල කාර්යභාරය

- ❋ ක්ෂේත්‍ර කටයුතුවල නියැලීම.
- ❋ කට්ටිකරුවන් තෝරා ගැනීම් පරීක්ෂණවලට සහභාගිවීම සහ ඔවුන් දැනුවත් කිරීම.
- ❋ රජයේ අවශ්‍යතාවය මත ආයතනවලට සහ පුද්ගලික ආයතනවලට ඉඩම් ලබාදීමේදී මැදිහත්වීම.
- ❋ ප්‍රධාන කාර්යාලයේ අවසරය පරිදි බෙදාදීමට ඇති ඉඩම් රජයේ ආයතනවලින් නිදහස් කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.
- ❋ කට්ටිකරුවන් වෙත ඉල්ලුම්පත් බෙදාදීම සඳහා ඒ/එල් පෝරමය පරීක්ෂාකර බලා නිර්දේශ කිරීම.
- ❋ සභාපති, විධායක අධ්‍යක්ෂ උපදෙස් මත අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂිත ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහභාගිවීම.

- ❋ කාර්යාලයේ සඳුදා /බදාදා මහජන දින පැවැත්වීම හා ඊට අදාළ රාජකාරි කටයුතු ඉටු කිරීම.

- ❋ ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීමට, අවශ්‍ය තොරතුරු සම්පාදනය කරමින් ලිපිගොනු පවත්වාගෙන යාම.

- ❋ දිස්ත්‍රික්කයේ නඩුවලට අධ්‍යක්ෂවරුන් යායුතු අවස්ථාවලදී සහභාගිවීම

- ❋ ප්‍රතිපත්ති හා වැදගත් තීරණ ගැනීම සඳහා සභාපතිතුමාට වාර්තා කිරීම.

- ❋ රාජකාරී කටයුතු සඳහා පැමිණෙන මහජනතාවට සහ ප්‍රකාශකයින් වෙනුවෙන් සභාපති අධීක්ෂණය යටතේ ඔවුන්ගෙන් තොරතුරු ලබා ගැනීම අවශ්‍ය උපදෙස් ලබාදීම.

- ❋ දිස්ත්‍රික් කාර්යාලයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය.

- ❋ ආදායම් රැස් කිරීම.

- ❋ ක්ෂේත්‍ර නිලධාරින්ගේ ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය සහ පුහුණු කිරීම.

- ❋ ප්‍රකාශිත එහෙත් ක්ෂේත්‍රයේ හඳුනා නොගත් ඉඩම් සහ ප්‍රකාශ නොකළ අක්කර 50 ට වැඩි ඉඩම් සම්බන්ධ තොරතුරු සොයා බැලීම හා වාර්තා කිරීම.

- ❋ කොම්පන් සභාවේ ඉදිරි පැවැත්ම සඳහා ආදායම් තත්වය දියුණු කිරීමට කටයුතු කිරීම.

- ❋ ක්ෂේත්‍ර නිලධාරින් විසින් ඉදිරිපත් කරන පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය ක්ෂේත්‍රයන් පරීක්ෂා කිරීම.

- ❋ කට්ටිකරුවන් දැනුවත් කිරීමේ සහ තෝරා ගැනීමේ පරීක්ෂණවලට සහභාගිවීම.

- ❋ ඉඩම් නිරවුල් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම.

- ❋ ඔප්පු උත්සව සංවිධාන කටයුතු කිරීම.

**04.3 අභ්‍යන්තර විගණන අංශය**

**✸ හැඳින්වීම හා කාර්යයන්**

i 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත හා 1971 අංක 38 දරන මුදල් පනත අනුව සැකසුණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා මුදල් සංග්‍රහයේ ii වන කොටසේ 2 වන වගන්තිය උපවගන්තිය 01-03 අනුව ලැබී ඇති බලය පරිදි රාජකාරී ඉටු කිරීම.

ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරුණු කෘෂිකාර්මික ඉඩම් සඳහා වන්දි හා පොලි ගෙවීම් පූර්ව විගණනය.

iii ඔප්පු පිළියෙල කිරිමේදී ඊට අදාල ලියවිලි පවතිද තක්සේරු වාර්තා මුදල් අයකර ගැනිම් පුද්ගල තත්වය ආදි කරුණු වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.

iv විගණකාධිපතිගේ වාර්තා අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අවසාන ගිණුම්වල දැක්වෙන අඩුපාඩු අවම කර ගනිමින් ඉදිරි කටයුතු කිරීමට සහායවීම.

v විගණකාධිපතිගෙන් යොමු වන විගණන විමසුම් සඳහා අදාල අංශවලින් තොරතුරු කැඳවීම. ප්‍රමාණවත්භාවය පරීක්ෂා කිරීම හා යොමුවන පැමිණිලි අනුව පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

**2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා ඉටුකර ඇති ප්‍රධාන කාර්යයන්**

## 01. මුදල් අංශයේ කටයුතු විගණනය

i ලැබීම් හා ගෙවීම් පරීක්ෂාව

2014 වර්ෂයේ නියැදි පරීක්ෂණ ලෙස ජනවාරි, ජූලි, සැප්තැම්බර්, මාසයන්ට අදාල ගිණුම් අංක 193393 හා ගිණුම් අංක 1443 ට අදාල මුදල් පොත, මුදල් භාරදෙන වවුචර්, කුවිතාන්සි පොත්, මුදල් තැන්පත් කිරීමේ ලදුපත්, බැංකු ප්‍රකාශය, බැංකු සැසඳුම් විස්තර, මුදල් ඇණවුම් ලේඛන ගෙවීම් වවුචර්පත් හා ආදායම් වියදම් එම වැය ශීර්ෂ යටතේ සටහන් කිරීම නිවැරදිද යන්න. චෙක්පත් අවලංගු කිරීමේ ලේඛනය හා චෙක් උප පත්‍රිකා නිවැරදි දැයි යන්න විගණනය කිරීම.

ii ගිණුම් අංක 1415 ට අදාල මාරු කිරීම් නිවැරදි ලෙස සටහන් වේද යන්න පරීක්ෂා කිරීම.

iii පාරිතෝෂික මුදල් ගෙවීම් වවුචර්පත් 14 ක් පූර්ව විගණනය කිරීම.

iv ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයින් අන්තර්ග්‍රහන ක්‍රියාවලියට ඇතුලත් වූ හෙයින් මූලික වැටුප් තලයන්හි පිහිටුවීම මත සියළුම සේවකයින්ගේ වැටුප් පත්‍රිකා විගණනය කිරීම.

v සරප් අංශයේ පොත්පත් හා මුදල් සත්‍යාපනය කිරීම අවස්ථා 02

vi ප්‍රධාන ගබඩාව පරීක්ෂාව අවස්ථා 01

vii ආපදා ණය, එක් මාසික ණය, පාසැල් පොත් ණය ලෙජර් නියැදි පරීක්ෂණයට ලක් කිරීම.

Viii 2014 වර්ෂයේ ප්‍රසාද දීමනා වවුචර්පත් විගණනය කිරීම
(නිවාඩු ලේඛන සමග)

## 02. තක්සේරු හා වන්දි අංශ කටයුතු විගණනය

i. වන්දි ලිපිගොනු 16 ක් සහ පොලී ගෙවීමට අදාල ලිපිගොනු 08 ක් පූර්ව විගණනයට ලක් කිරීම.

ii. වන්දි හා පොලී ගෙවීම් අවසන් කිරීමට නොහැකි අවස්ථා

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම් තහවුරුකර නොමැතිකම නිසා වන්දි ගෙවීමට නොහැකිවීම.
- වන්දි වෙනුවට හුවමාරු ඉඩම් ඉල්ලා සිටීම.
- බුක්තිය භාර ගැනීමේ සහතික නොමැතිවීම.
- ප්‍රකාශකයින් වෙත යවන ලද වන්දි ප්‍රදාන ලිපියට අනුමැතිය නොලැබීම හා වවුචර්පත් අත්සන් කර භාර නොදීම.
- ගැසට් නිවේදන පල කොට වන්දි තීරණය කිරීම.

වන්දි ගෙවීමට අදාලව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පල කිරීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි සමග සාකච්ඡාකර එය විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව කොමිෂන් සභාවට සුදුසු පියවරක් ගැනීමට යොමු කිරීම.

## 03. ඉඩම් පැවරීම් අංශයේ විගණන කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පවතින චක්‍රලේඛ හා මාර්ගෝපදේශ අනුගමනය කරමින් ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහන් යටතේ ඉඩම් පැවරීම් අංශයේ ඒ/එල් අයදුම්පත්‍ර හා අදාල ලේඛන පැවරීම් ලිපිගොනු සමග විගණනය කිරීම.

## 04. ආදායම් අංශයේ කටයුතු විගණන කටයුතු

i. ලෙජර් පවත්වාගෙනයාම පරීක්ෂාව.
ii. හිග බදු මුදල් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පරීක්ෂාව.
iii. ඉලක්කගත ආදායම් සපුරා ගැනීම පිළිබඳව පරීක්ෂාව.
iv. අධ්‍යක්ෂ/ආදායම් සමග සාකච්ඡා කරමින් බදු ලිපිගොනු වල අඩුපාඩු සකස්කර ගැනීම සඳහා සුදුසු පියවරක් ගැනීමට විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සහ ඒ පිළිබඳ පසු විපරම් කිරීම.

## 05. කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශයේ විගණන කටයුතු

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයින්ගේ පැමිණීමේ පිටවීමේ සටහන් පත්‍ර හා නිවාඩු ලේඛණ, වැටුප් රහිත නිවාඩු පරීක්ෂාව.
ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වාහන අලුත්වැඩියාව, ධාවන සටහන් නියැදි පරීක්ෂාවන් කිරීම.
iii. ටෙන්ඩර් මණ්ඩල කටයුතු පරීක්ෂාව.
iv. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සමස්ත සේවකයින් නව බඳවා ගැනීමේ පරිපාටියට අනුව හා කළමනාකරණ සේවා අංක 30 ට අනුව සිදු කළ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.

## 06. නීති අංශයේ විගණන කටයුතු

නීති වියදම් අවම කිරීම සඳහා නීති අංශයේ නඩු ලිපිගොනු පරීක්ෂා කිරීමෙන් පසු හා නීති නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ අතර එමගින් ලත් තීරණ මත කඩිනම් යෝජනා මාලාවක් ඉදිරිපත් කිරීම.

## 06. විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කිරීම.

i. 2014 වර්ෂයට අදාළව ලත් විගණන විමසුම් 21 ක් සඳහා අංශවලින් තොරතුරු කැඳවීම් හා ඒ අනුව පිළිතුරු ලිපි සකස්කර ඉදිරිපත් කිරීම.

ii. 1971 අංක 58 දරන මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවන්ට පිළිතුරු සැපයීම.

## 07. කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් පැවැත්වීම

2014 වර්ෂය තුළ කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ලබාගත් තීරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කර අදාළ අංශයන්ට වාර්තා කිරීම හා ඒවා සම්බන්ධයෙන් පසු විපරම් කිරීම.

## 08. දිස්ත්‍රික් කාර්යාල විගණන පරීක්ෂාව

නුවරඑළිය, කළුතර, කොළඹ, මාතර, ඇඹිලිපිටිය, හම්බන්තොට, බදුල්ල, මහනුවර, අම්පාරල පුත්තලම, මාතලේ යන කාර්යාලවල පැමිණිමේ ලේඛනය, නිවාඩු ලේඛනය, ගිණුම් සම්බන්ධ පොත් හා ලේඛන ඉන්වෙන්ට්‍රි, ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වැඩ සටහන් විස්තර හා ක්ෂේත්‍ර පරීක්ෂාව, අදාළ ගොවි නාම ලේඛනය, ඉඩම් ලේඛන, බදු ලේඛන, කාර්යමණ්ඩලයේ රාජකාරි පැවරීම් ආදිය පරීක්ෂා කිරීම.

## 09. කොමිෂන් සභා තීරණ හා ව්‍යාපෘති තාක්ෂණික කමිටු තීරණ ක්‍රියාත්මකවීම පිළිබඳ පසු විපරම් කිරීම.

සභාපතිතුමා, විධායක අධ්‍යක්ෂතුමාගේ හදිසි කැඳවීම්, සාකච්ඡා හා රැස්වීම් සඳහා සහභාගිවීම.

**04. ඉඩම් උපරිම සීමා අංශය**

**හැඳින්වීම හා කාර්යයන් :-**

i. උපරිමයට වැඩි එනම් අක්කර 50 ට වැඩි කෘෂිකාර්මික ඉඩම් අයිති පුද්ගලයින්ගෙන් ප්‍රකාශන ලබා ගැනීම.

ii. ප්‍රකාශන ඉදිරිපත් කළ පුද්ගලයින්ගෙන් එනම් ප්‍රකාශකයින්ගේ කැමැත්ත පරිදි ඔවුනගේ ඉඩම් වලින් අක්කර 50 ක් ව්‍යවස්ථාපිත නිශ්චය ලෙස වෙන්කර ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් පවරාදීම.

iii. ප්‍රකාශකගේ ඉල්ලීම පරිදි 1972.08.26 වන දිනට වයස අවු 18 ඉක්මවූ ඔහුගේ දරුවන්ට හෝ දෙමාපියන්ට එක් අයෙකුට අක්කර 50 ට උපරිමයට යටත්ව ඉඩම් ප්‍රතිංසස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම.

iv. ප්‍රකාශකගේ 1972.08.26 දින වන විට අවු 18 ට අඩු වූ නමුත් ඉඩම්වල අයිතිය තිබූ දරුවන්ට ප්‍රකාශකගේ ඉල්ලීම මත එක් අයෙකුට අක් 50 ක උපරිමයට යටත්ව පනතේ 22 ඊ වගන්තිය යටතේ ඉඩම් කොටස් ලබාදීම.

v. ඉහත නීතිමය බැඳීම් වෙනුවෙන් ඉඩම් ලබාදීමෙන් පසු කොම්පත් සභාවට පැවරෙන ඉඩම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු වන්දි ගෙවීම් සඳහා තක්සේරු හා වන්දි අංශය වෙත යොමු කිරීම.

1. i. 2014 වර්ෂයේ 2014.01.01 දින සිට 2014.12.31 දක්වා අංශයේ ප්‍රගතිය.

| | | |
|---|---|---|
| i. | සභාපතිතුමා, විධායක අධ්‍යක්ෂතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමිය වෙත වාර්තා ඉදිරිපත් කිරීම. | - 207 |
| ii. | දිස්ත්‍රික් කාර්යාලයෙන් වාර්තා කැඳවීම්/ලැබීම් | - 196 |
| iii. | අංශ/දිස්ත්‍රික් කාර්යාල වෙත පිළිතුරු හා විස්තර ලබාදීම | - 364 |
| iv. | අමාත්‍යාංශ/ආයතන /පුද්ගලයින් වෙත ලිපි යැවීම | - 321 |
| v. | තක්සේරු වාර්තා කැඳවීම් /ලැබීම් | - 43 |
| vi. | ජනාධිපති විමසීම් සඳහා පිළිතුරු | - 22 |
| vii. | ගොනුකිරීම් | - 190 |
| viii. | කොම්පත් පත්‍රිකා සකස් කිරීම් | - 81 |
| ix. | නඩු වලට සහභාගිවීම් | - 128 |
| x. | නඩු සාකච්ජා වලට සහභාගිවීම් | - 41 |
| xi. | ක්‍රියා නිමි රාජකාරි | - 39 |

2 . <u>ගැසට්පත්‍ර සැකසීම</u>

- ගා/30 ප්‍රත්‍යාදිෂ්ඨ (ලේල්වල වත්ත)
- කො/3365 22(1) ඊ සැසට්පත්‍ර සංශෝධන (රයිගම වත්ත)
- මාලේ/85 ප්‍රත්‍යාදිෂ්ඨ

**3 22(1) අ වගන්තිය යටතේ පැවරීම්**

- කො/3440 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය) ඔප්පු 01
- ගා/125 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) ඔප්පු 01
- නු/41 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) ඔප්පු 01

- කො/3260 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) ඔප්පු 01
- කො/3417 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) ඔප්පු 01
- කෑ/28 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) ඔප්පු 01
- පු/205 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) ඔප්පු 01
- මා/35 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) ඔප්පු 01
- ර/131 22(1)අ (පවුල තුල පැවරීම් විකල්ප) ඔප්පු 01
- කෑ/15 22(1) අ පවුල තුල පැවරීම්) ඔප්පු 01
- කු/33 22(1) අ (පවුල තුල පැවරීම්) ඔප්පු 01

**422(1) ඊ වගන්තිය යටතේ පැවරීම්**

- කු/33 22(1)ඊ (පවුල තුල පැවරීම්) ඔප්පු 02
- කෑ/32 22(1)ඊ (පවුල තුල පැවරීම්) ඔප්පු 02
- කො/2073 22(1)ඊ (පවුල තුල පැවරීම්) ඔප්පු 01
- කො/2237 22(1)ඊ (පවුල තුල පැවරීම් විකල්ප) ඔප්පු 01
- ගා/159 22(1)ඊ (පවුල තුල පැවරීම්) ඔප්පු 03
- කො/1370 22(1)ඊ (පවුල තුල පැවරීම් විකල්ප) ඔප්පු 01

**522(1) ඈ වගන්තිය**

- හම්/04 22(1)ඈ වගන්තිය ඔප්පු 01

**614 වන වගන්තිය**

- කො/2971 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 02
- කෑ/21 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 02
- කෑ/76 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 01
- කො/2770 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 01
- කෑ/18 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 01
- බ/105 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 01
- ර/104 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 02
- කො/1551 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 02
- කෑ/73 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 01
- බ/90 14 වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 01

**03. වෙනත්** 08

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පිළිබඳවද කොමිෂන් සභාව විසින් නිදහස් කර ඇති ඉඩම් පිළිබඳව කොමිෂන් සභාව සතුව දැනට ඇති ඉඩම් පිළිබඳ ලේඛන ඇතත් අවසානාත්මක නිවැරදි ලේඛනයක් ආයතනය සතුව නොමැතිවීම දීර්ඝ කාලයක සිට මුහුණදීමට සිදු වූ ගැටලුවකි.

එකී දීර්ඝ කාලීනව පැවැති ගැටලුවක් නිරාකරණය කර ගැනීමේ අටියෙන් ව්‍යවස්ථාපිත ප්‍රකාශක ආශ්‍රයෙන් මෙතෙක් ව්‍යවස්ථාපිත බැදීම සඳහා ලබාදීමට නොහැකි වූ ඉඩම් ප්‍රමාණය නිශ්චිතව ගණනය කිරීමටත් කොමිෂන් සභාව වෙත පැවරුණු සියලුම ඉඩම්වල බුක්තිය හා අයිතිය කොමිෂන් සභාව සතු වී ඇති බවට තහවුරු කර ගැනීම සඳහාත් කොමිෂන් සභාව සතු වූ ඉඩම්වලින් මෙතෙක් සිදු කල බැහැර කිරීම්ද ඇතුලත් කොට වෙනම සංචිතයක් මගින් ඉඩම් ලේඛනයේ රාජකාරී ඉටු කර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර එකී කාර්යයෙන් 90% ක පමණ ප්‍රගතියක් මේ වන විට ළගා කර ගැනීමට හැකියාව ලැබී ඇත

**05 තක්සේරු හා වන්දි අංශය**

**හැඳින්වීම හා කාර්යයන්**

i. වන්දි සම්බන්ධ ඉඩම්වල අයිතියේ නිරවද්‍යතාව සහතික කරවා ගැනීම.
ii. උරුමයන් පිළිබඳව හා වන්දි බෙදී යාම බුදල් නඩු පිළිබඳව (වන්දි වලට අදාළ) පරීක්ෂා කිරීම.
iii. ප්‍රකාශකයින්ගෙන් අවසාන වශයෙන් කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් සඳහා වන්දි ගෙවීම.
iv. ඉඩම් පැවරීම්, විකිණීම් ආදිය සඳහා රජයේ තක්සේරු වාර්තා කැඳවීම.

**<u>අංශයේ කාර්ය භාරය.</u>**

මෙම අංශයේ කාර්යභාරය කොටස් 2 කින් යුක්තය.

01. කොමිෂන් සභාවට පැවරුණු ඉඩම් සඳහා වන්දි ගෙවීම (වන්දි අංශය)
02. කොමිෂන් සභාවට අයත් ඉඩම් විකිණීම්, බදුදීම් සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තා කැඳවීම.

**කාර්යභාරය 01**

01. i. ප්‍රකාශිත ඉඩම්වලින් කොම්පන් සභාව වෙත සතු වූ ඉඩම් සම්බන්ධයෙන් වන්දි ගෙවීමට කටයුතු කිරීම.

මේ සඳහා 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පන් සභා පනතේ 29 වන වගන්තියේ සිට පනතේ දක්වා ඇති 42 වන වගන්තිය මගින් සලසා ඇති නීතිමය ප්‍රතිපාදනයන් හා සංශෝධිත පනත් මගින් දක්වා ඇති මාර්ගෝපදේශ භාවිතයට ගැනේ.

**කාර්යභාරය 02**

02. i. කොම්පන් සභාව විසින් අනුමත කරනු ලබන ඉඩම් විකිණීම් බදුදීම් සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා කැඳවීම හා එම තක්සේරු වටිනාකම් ඉදිරි කටයුතු සඳහා ඉඩම් පැවරීම්, ඉඩම් උපරිම සීමා හා ව්‍යාපෘති අංශය වෙත වාර්තා කිරීම.

ii. උක්ත ක්‍රියාකාරකම් 2 ට අමතරව බදු සංශෝධනය කිරීම සඳහා ජනාධිපති ලේකම්ගේ SEI/A/4/34 දරණ චක්‍රලේඛය යටතේ දක්වා ඇති පරිදි බදු සංශෝධනය කිරීම සඳහා කටයුතු කිරීම. (ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව කැඳවීමට යටත්ව)

iii. දැව තක්සේරු කිරීම හා දළ තක්සේරු වාර්තා පිළියෙළ කිරීම.

## 2014 වර්ෂයේ කාර්ය සාධනය

| අනු අංකය | ක්‍රියාකාරකම් | භෞතික | | | | මූල්‍ය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ඉඩම් විකිණීම | | | | |
| | | ඉඩම් බදුදීම් | විකිණීම් | පවුල තුළ පැවරීම් | වන්දි හා පොලී ගෙවීම් | බදුදීම් රු. | හුවමාරුව මත විකිණීම් රු. | විකිණීම් රු. | වෙනත් ඉපයීම් රු. | ගෙවීම් රු. |
| 1. | තක්සේරු කැඳවීම් | **70** | **335** | **36** | | | | | | |
| 2. | නිකුත් කල තක්සේරු වාර්තා | **66** | 419 | 14 | | **27,832,085**<br>බදු ප්‍රතිශතය 4% හා 6% | **32,723,549.47** | **569,139,069.30** | | |
| 3. | බදු කුලී සංශෝධන | | | | | | | | **3,488,345/-** | |
| 4. | දැව තක්සේරු කිරීම | | 194 | | | | | | **1,390,636.73** | |
| 5. | කළුගල් හා වෙනත් | - | - | - | | | නැත | | 8,480,000.00 | |
| 6. | සේවා ගාස්තු ඉපයීම් | - | - | - | | | | | **3,499,362.80** | |
| 7. | ප්‍රකාශකයින් සඳහා වන්දි ගෙවීම් | - | - | - | 20 | | | | | 4,667,689.47 |

## 06. ඉඩම් පැවරීම් අංශය

**කාර්යයන් :-**

i. නිවාස අරමුණු සඳහා පුද්ගලයන්ට ඉඩම් පැවරීම.

ii. රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවලට ඉඩම් විකිණීම /බදුදීම.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් කොටස් විකිණීම.

iv. ඉඩම් කච්චේරි පැවැත්වීම හා අනවසර නියමානුකූල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

v. මැනුම් නියෝග පිළිබඳ කටයුතු.

vi. මැනුම් ගැටලු වලට උපදෙස් ලබාදීම.

vii. දිස්ත්‍රික් කාර්යාලවල ක්ෂේත්‍ර වාර්තා ලබා ගැනීම.

viii. මැනුම් සැලසුම්වලට අදාල කටයුතු සම්බන්ධීකරණය.

ix. අනවසරකරුවන් පිළිබඳ ලේඛන යාවත්කාලීන කිරීම හා පසු විපරම.

x. අනවසරකරුවන් ඉවත්කිරීම හා ඒ පිළිබඳ පියවර ගැනීම හා පරීක්ෂණ පැවැත්වීම.

xi. ඉඩම් නියමානුකූල කිරීමේ ආකෘති පත්‍රය ලබා ගැනීම. අධීක්ෂණය හා පසු විපරම.

xii. අනුප්‍රාප්තිය පිළිබඳ කටයුතු.

xiii. ඉඩම් විකුණුම් අයදුම්පත් පිළිබඳ කටයුතු.

xiv. දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණ කටයුතු.

2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා ඉටුකර ඇති කාර්යයන්

**i. විකිණීම.**

| | **පුද්ගලයින් ගණන** | **ප්‍රමාණය අක්. රූඩ්. පර්.** |
|---|---|---|
| i. නිවාස අරමුණ සඳහා පුද්ගලයින්ට පැවරීමට අදාළ ඔප්පු සකස් කිරීමට යොමු කිරීම | 2400 | 688 1 29.9 |
| ii. රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවල ඉඩම් විකිණීමට අදාළ ඔප්පු සකස් කිරීමට යොමු කිරීම | 34 | 172 3 38.04 |
| iii පුද්ගලයින්ට විකිණීමට (කුඹුරු) අදාළ ඔප්පු සකස් කිරීමට යොමු කිරීම | 25 | 27 2 06.08 |

## 07. ව්‍යාපෘති අංශය

### හැඳින්වීම හා කාර්යයන්

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් බදුදීමේදී (ව්‍යාපෘති සඳහා) අනුගමනය කරනු ලබන නියමිත ක්‍රමවේදය මත ඉඩම් බදුදීම.

ii. ව්‍යාපෘතිය සඳහා ඉඩම් බදුදීමට ප්‍රථම ව්‍යාපෘති කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iii. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ වාර්තා සකස් කිරීම.

iv. විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම.

v. තක්සේරු වාර්තා කැඳවීම.

vi. බදු මුදල් අයකර විධිමත් බදු ගිවිසුමක් ලබාදීම.

| | 2014 ඉලක්ක | 2014 ප්‍රගතිය |
|---|---|---|
| නව බදුදීම් | **33** | **68** |
| ගිවිසුම් රහිත බදුකරුවන් ගිවිසුම් වලට ඇතුලත් කරවා ගැනීම් | **15** | **09** |
| අනුමත ආයෝජන මණ්ඩල/කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සඳහා ඉඩම් ලබාදීම | **20** | **06** |
| ව්‍යාපෘති කමිටු වෙත ඉදිරිපත් කිරීම | **30** | **22** |
| ඛණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති (වැලි, කළුගල්, සිලිකා ඩොලමයිට්, මැණික් | **44** | **12** |

1. මැණුම් නියෝග නිකුත් කිරීම

   කර්මාන්ත කටයුතු සඳහා - **26**

   කෘෂි කාර්මික කටයුතු සඳහා - **49**

   ඛණිජ සම්පත් - **10**

   වෙනත් කාර්යයන් - **20**

2. කොමිෂන් සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

   කර්මාන්ත කටයුතු සඳහා - **36**

   කෘෂි කාර්මික කටයුතු සඳහා - **28**

   ඛනිජ සම්පත් - **12**

වෙනත් කාර්යන් - 07

ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තා කැඳවීම් - 12

තක්සේරු දන්වා යැවූ ලිපි සංඛ්‍යාව - 38

තක්සේරු මුදල - රු. 122,936,473.07

බදු ගිවිසුම සැකසීමට යොමු කිරීම - 26

ව්‍යාපෘති කමිටු සඳහා ඉදිරිපත් කළ සංඛ්‍යාව - 22

**08. ඔප්පු අංශය**

**හැඳින්වීම හා කාර්යයන්**

**i. අරමුණු :-**

කෘෂිකාර්මික කටයුතු, නිවාස අරමුණු සහ කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම මත සහ විකිණීමේ පදනම මත තෝරාගත් පුද්ගලයන් සහ ආයතන සඳහා ඉඩම් බැහැර කිරීම සිදු කරනු ලබන අතර එසේ කරන බැහැර කිරීම ඔප්පු සකස් කිරීම තුළින් සිදු කරනු ලබයි.

## ii. කාර්යභාරය :-

දිවයිනේ සියලුම දිස්ත්‍රික් අවරණය වන ආකාරයට 2014 වසර තුළ ප්‍රතිලාභින් 3500 කට ආසන්න සංඛ්‍යාවකට ඔප්පු නිකුත් කර ඇත. මේ අනුව මෙම අංශය මගින් ප්‍රතිලාභ පවුල් දළ වශයෙන් 55000 කට පමණ ඉඩම් අයිතිය ලබාදී ඇත.

**2. i. 2014 වර්ෂයේදී ලබාදුන් ඔප්පු සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | ඔප්පු සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 122 |
| ගම්පහ | 341 |
| කෑගල්ල | 365 |
| කළුතර | 185 |
| මාතලේ | 85 |
| බදුල්ල | 251 |
| කුරුණෑගල | 220 |
| පුත්තලම | 385 |
| මහනුවර | 385 |
| නුවරඑලිය | 218 |
| අනුරාධපුර | 60 |
| මඩකලපුව | 103 |
| අම්පාර | 102 |
| ත්‍රිකුණාමලය | 15 |
| මාතර | 110 |
| හම්බන්තොට | 45 |
| ගාල්ල | 218 |
| රත්නපුර | 111 |
| මොනරාගල | 98 |
| ඇඹිලිපිටිය | 81 |
| **එකතුව** | **3500** |

**ii.2014 වර්ෂයේදී ඔප්පු ලබාදීමෙන් පසු බැංකු ලිපි හා පැවරුම් ලිපි නිකුත් කරමින් ලත් ආදායම**

| මාසය | ආදායම රුපියල් |
|---|---|
| ජනවාරි | 1,24,000.00 |
| පෙබරවාරි | 1,12,000.00 |
| මාර්තු | 1,18,500.00 |
| අප්‍රේල් | 1,03500.00 |
| මැයි | 2,22,500.00 |
| ජූනි | 1,28,500.00 |
| ජූලි | 1,19,500.00 |
| අගෝස්තු | 1,26,000.00 |
| සැප්තැම්බර් | 1,20,,500.00 |
| ඔක්තෝම්බර් | 1,29,500.00 |
| නොවැම්බර් | 2,16,500.00 |
| දෙසැම්බර් | 2,14,500.00 |
| **එකතුව** | **1,835,000.00** |

**09. මැනුම් හා වෙන්කිරීම් අංශය**

**කාර්යයන් :-**

නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම, වාණිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් බදුදීම හා ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ලබාදිය යුතු ඉඩම් මැනීම සහ ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය වේ. දිස්ත්‍රික් වශයෙන් තෝරා ගත් බලයලත් මිනින්දෝරුවරුන්ගේ ලැයිස්තුවක් වාර්ෂිකව යාවත්කාලීන කොට ඔවුන්ගේ සේවය ලබා ගනු ලබයි. මේ හැර රජයේ මිනින්දෝරු දෙපාර්තුමේන්තුව සහ බිම්සවිය ඇතුළු අනෙකුත් රාජ්‍ය අංශයේ ඉඩම් මැනුම් කිරිමේ කටයුතු අධීක්ෂණය මෙම අංශය මගින් සිදු කරනු ලබයි. එසේම මෙම අංශය මගින් 2014 වර්ෂය තුළ දළ වශයෙන් අක්කර 3384 ක් පමණ විකිණීම් මගින් බැහැර කර ඇත.

i. සියලුම දිස්ත්‍රික්කයන්හි මැනුම් කටයුතු සඳහා උපදෙස් ලබා දී අධීක්ෂණය හා එක් එක් ඉඩම් සඳහා පිඹුරුපත් පරීක්ෂාකර අනුමත කිරීම.

ii. බදුදීම විකිණීම ව්‍යවස්ථාපිත නිශ්චය හා පවුල තුළ පැවරීම් සඳහා අනුමත කරන ලද පිඹුරුපත් අදාළ ආයතන වෙත නිකුත් කිරීම.

iii අවශ්‍යතාවය අනුව ක්ෂේත්‍රයේ මායිම් කටයුතු හා ඉඩම් හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්තවීම.

iv ඉඩම් උපරිමය යටතේ ඔප්පු සකස් කිරීම.

## 2014 වර්ෂයේ මැනුම් හා වෙන්කිරීම් අංශයේ ප්‍රගතිය

| මාසය | අනුමත පිඹුරු | කැබලි | ප්‍රමාණය | | | | සංශෝධන | නිකුත් කරන ලද පිටපත් | ඒ සඳහා අය කරන ලද මුදල(රුපියල්) | 10% අධීක්ෂණ ගාස්තු රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | අක්කර | රූඩ් | පර්චස් | හෙක්ටයාර් | | | | |
| ජනවාරි | 44 | 2025 | 1003 | 1 | 25 | 406.0581 | 12 | 31 | 41,000.00 | - |
| පෙබරවාරි | 28 | 523 | 205 | 3 | 12 | 83.2933 | 09 | 33 | 36,000.00 | - |
| මාර්තු | 50 | 412 | 491 | 2 | 36 | 198.9930 | - | 45 | 49,000.00 | 139,100.00 |
| අප්‍රේල් | 41 | 1135 | 1741 | 1 | 36 | 705.1398 | - | 18 | 26,000.00 | 414,324.00 |
| මැයි | 23 | 167 | 143 | 1 | 30 | 58.0467 | 02 | 18 | 21,000.00 | 22,800.00 |
| ජූනි | 27 | 483 | 330 | 3 | 33 | 133.9309 | 02 | 25 | 25,000.00 | 62,750.00 |
| ජූලි | 40 | 756 | 743 | 0 | 31 | 300.7532 | 02 | 25 | 26,000.00 | 115,350.00 |
| අගෝස්තු | 29 | 1165 | 993 | 1 | 36 | 402.0395 | 04 | 29 | 35,000.00 | 253,100.00 |
| සැප්තැම්බර් | 35 | 352 | 342 | 3 | 15 | 138.7420 | 08 | 82 | 93,000.00 | 130,517.00 |
| ඔක්තෝම්බර් | 37 | 854 | 526 | 3 | 37 | 213.2587 | 06 | 91 | 101,000.00 | 40,850.00 |
| නොවැම්බර් | 26 | 333 | 296 | 4 | 25 | 1202542 | 02 | 45 | 50,000.00 | 84,350.00 |
| දෙසැම්බර් | 43 | 1256 | 958 | 1 | 06 | 387.7986 | - | 16 | 22,000.00 | 330,680.00 |
| **එකතුව** | **423** | **9461** | **7778** | **3** | **2** | **31483080** | **47** | **458** | **525,000.00** | **1,593,821.00** |

## 10. නීති අංශය

### I. හැඳින්වීම :-

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, සිවිල් අභියාචනාධිකරණය, කම්කරු විනිශ්චය සභාව, කම්කරු ආරවුල්, මානව හිමිකම් කොමිෂන් සභාව සහ ඔම්බුඩ්ස්මන් යන ආයතන මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විරුද්ධව සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් පුද්ගලයින්ට සහ ආයතනවලට විරුද්ධව වශයෙන් සම්පූර්ණ නීතිමය කාර්යයන් 448 ක් සඳහා ලිපිගොනු සැකසීම වාර්තා ඉදිරිපත් කිරීම, පෙරකලාසි සම්බන්ධ කටයුතු, පෙනී සිටීම, නීති උපදෙස් විවිධ පැවරුම් සඳහා ලබාදීම ආදි කටයුතු කොමිසමට එරෙහිව පවතින නඩු සම්බන්ධව ක්‍රියාකිරීම සහ කොමිසම විසින් පවරනු ලබන නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම නීති අංශයේ ප්‍රධාන කාර්යය වේ.

### II. කාර්යයන් :-

- ❋ නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- ❋ දිස්ත්‍රික් කාර්යාලවලට අදාළ නඩු පිළිබඳව අදාළ නීතිඥයින් සම්බන්ධීකරණය කර ගැනීම.
- ❋ ආයතනයේ නීති පිළිබඳ උපදේශන සේවා සැපයීම.

### III. නඩු අවම කිරීමට ගත් ක්‍රියාමාර්ග

- ❋ මැනුම් සිතියම් කිරීමේදි නිවැරදි ක්‍රමවේද අනුගමනය කිරීම.
- ❋ ක්ෂේත්‍ර නිලධාරි පුහුණු කිරීම.
- ❋ නීතිමය අත්දැකීම් අංශ අතර හුවමාරු කර ගැනීම.
- ❋ දිස්ත්‍රික් කාර්යාල සමග නඩු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

## IV. පවතින නඩු සංඛ්‍යාව

| | 2014 වර්ෂය තුළ නිම කල සහ සමථයට පත් වූ නඩු සංඛ්‍යාව | 2014 වර්ෂය තුළ පවරන ලද නඩු සංඛ්‍යාව | 2014.12.31 දිනට පැවැති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 07 | - | 24 |
| අභියාචනාධිකරණය | 09 | 10 | 35 |
| මහාධිකරණය | 01 | 03 | 10 |
| දිසා අධිකරණය | 12 | 55 | 341 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 02 | 02 | 16 |
| සිවිල් අභියාචනාධිකරණය | 14 | 12 | 18 |
| ප්‍රාථමික අධිකරණය | - | 01 | - |
| කම්කරු විනිශ්චය සභාව | 01 | 01 | 02 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 01 | - | - |
| කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව | - | - | 02 |
| **එකතුව** | **46** | **84** | **448** |

## 11. විමර්ශන අංශය

### 1. කාර්යයන්

i පුද්ගලයින්ගෙන් සහ ආයතනවලින් ලැබෙන්නා වූ ඉඩම් පැමිණිලි සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කිරීම.

ii ඊට අදාල පාර්ශ්වයන් කැඳවා පරීක්ෂණයන් පැවැත්වීම හා ගැටලුව විසඳීමට අවශ්‍ය සුදුසුම ක්‍රියාමාර්ගයන් යෝජනා කිරීම.

iii ගැටලු සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ, ස්ථාන පරීක්ෂණ හා විමර්ශන කටයුතු සිදුකිරීම.

## 2. 2014 වර්ෂයේදී ඉටු කර ඇති කාර්යයන්

i. සිදු කරන ලද සම්පූර්ණ පරීක්ෂණ සංඛ්‍යාව - **53**

ii.. ඉදිරි කටයුතු කිරීමට දිස්ත්‍රික් කාර්යාල වලට යොමු කිරීම් සංඛ්‍යාව - **13**

iii. වාහන අනතුරු සම්බන්ධව සිදු කළ මූලික විමර්ශන සංඛ්‍යාව - **03**

## 12. මුදල් අංශය

### කාර්යයන්

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ මාසික වැටුප් හා දීමනා ගෙවීම් කිරීම.

ii නිලධාරීන්ට අයත් සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් නියමිත දිනයන්හිදී තැන්පත් කිරීම.

iii මාසික ගිණුම් වාර්තා සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

iv මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන නියමිත දිනට සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

v. මාසික හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන විගණකාධිපති හා අමාත්‍යංශය වෙත යොමු කිරීම.

vi ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලැබෙන්නා වූ ආදායම් අත්‍යාවශ්‍ය රාජකාරී වලට පමණක් වියදම් කර ඉතිරි මුදල් වඩාත් ඵලදායී ලෙස ආයෝජන කාර්යයේ යෙදවීම. දිස්ත්‍රික් කාර්යාල 20 තුළ මුදල් පාලනය, අධීක්ෂණය හා උපදෙස් ලබාදීම, තොග සටහන් පොත් පවත්වා ගෙන යාම.

vii අවසාන ගිණුම් වාර්තාව සැකසීම.

viii ලංකා බැංකුව, මහා භාණ්ඩාගාරය, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන මූල්‍ය ආයතන සමග සම්බන්ධීකරණය

ix මිලදී ගැනීම් කටයුතු

## 13. ආදායම් අංශය

**1.**

i. ඉඩම් බදුදීම්, විකිණීම්වලින් ලැබෙන්නා වූ ආදායම් රැස් කිරීම, හිග බදු මුදල් අයකර ගැනීමට සුදුසු පියවර ගැනීම.

ii බනිජ සම්පත් සහ වෙනත් ආදායම් මාර්ගවලින් ලැබෙන්නා වූ ආදායම් එකතු කිරීම

iii ඉඩම් අත්පත් පරීක්ෂණ සඳහා සහභාගිවීම සහ එයින් ලැබෙන්නා වූ ආදායම රැස් කිරීම.

iv සැගවුණු ඉඩම් සොයා ගැනීමෙන් පසුව එයින් ලැබෙන්නා වූ ආදායම් එක්රැස් කිරීම.

2. 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් වියදම් ප්‍රකාශය

| | විස්තරය | 2014 රුපියල් | 2013 රුපියල් |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| ඉපයීම | 1 | 223,565,721.41 | 217,548,015.75 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 2 | 102,339,485.53 | 98,694,306.08 |
| **මුළු ආදායම** | | **325,905,206.94** | **316,242,321.83** |
| | | | |
| **වියදම්** | | | |
| පරිපාලන වියදම් | 3 | 223,355,075.14 | 192,400,813.52 |
| සැපයුම් හා අවශ්‍ය දෑ | 4 | 11,211,248.39 | 11,798,272.18 |
| අනෙකුත් ක්‍රියාකාරී වියදම් | 5 | 12,170,565.51 | 9,633,455.50 |
| මූල්‍ය වියදම් | 6 | 5,193,735.10 | 5,313,742.73 |
| **මුළු වියදම** | | **251,930,624.14** | **219,146,283.93** |
| | | | |
| **අතිරික්තය** | | **73,974,582.80** | **97,096,037.90** |
| | | | |
| **කාල පරිච්ජේදයට අදාල ශුද්ධ අතිරික්තය** | | **73,974,582.80** | **97,096,037.90** |
| | | | |
| 2014.01.01 දිනට ආරම්භක ශුද්ධ අතිරික්තය | | 745,925,846.17 | 645,693,429.99 |
| | | | |
| **2014.12.31 දිනට සංචිත අතිරික්තය** | | **819,900,428.97** | **742,789,467.89** |
| | | | |

## 2014.12.31 දිනට ශේෂ පත්‍රය

| | විස්තරය | 2014<br>රුපියල් | 2013<br>රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | - | - |
| ***ජංගම වත්කම්*** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 7 | 91,409,002.82 | 76,304,934.92 |
| ලැබිය යුතු පොලිය | 8 | 20,727,959.34 | 20,333,273.68 |
| ලැබිය යුතු ආදායම් | | 29,731,610.01 | 29,731,610.01 |
| වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ | 9 | 2,218,345,567.95 | 2,218,646,521.95 |
| | | | |
| තැන්පතු හා අත්තිකාරම් | 10 | 59,677,971.85 | 53,778,155.89 |
| තොග - ලිපිද්‍රව්‍ය | 11 | 2,174,603.00 | 1,439,845.04 |
| | | | |
| | | | |
| ***ජංගම නොවන වත්කම්*** | - | | |
| ආයෝජන | 12 | 1,036,957,466.29 | 882,558,889.63 |
| දේපල හා යන්ත්‍රෝපකරන | 13 | 45,546,228.97 | 57,369,066.66 |
| ඉඩම් | | 676,169,345.33 | 676,169,345.33 |
| - | - | | |
| | | | |
| **මුළු වත්කම්** | | **4,180,739,755.56** | **4,016,331,643.11** |
| | | | |
| **වගකීම්** | - | | |
| | | | |
| ***ජංගම වගකීම්*** | - | - | - |
| වාණිජ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 14 | 100,578,369.37 | 95,381,109.55 |
| කල්බදු ණයහිමියන් | 15 | 7,157,999.23 | 9,051,847.79 |
| | | | |

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| ***ජංගම නොවන වගකීම්*** | - | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 16 | 58,131,775.50 | 37,749,580.00 |
| කල්බදු ණයහිමියන් | 17 | 3,508,486.68 | 10,095,929.37 |
| වන්දි අවිනිශ්චිත ගිණුම අදියර I | | 113,276,122.66 | 119,139,914.66 |
| වන්දි අවිනිශ්චිත ගිණුම අදියර II | | 109,959,492.95 | 109,959,492.95 |
| | | | |
| | - | | |
| | | | |
| **ශුද්ධ වටිනාකම** | | | |
| රජයේ දායකත්ව හා භාණ්ඩාගාර ප්‍රදාන | 18 | 1,964,075,000.00 | 1,964,075,000.00 |
| සංචිත | 19 | 1,004,152.080,20 | 928,089,300.90 |
| සමස්ත අතිරික්තය | | 819,900,428.97 | 742,789,467.89 |
| | | | |
| | | | |
| **ශුද්ධ වත්කම් හා ස්කන්ධය** | | **4,180,739,755.56** | **4,016,331,643.11** |

| ……………………….. | ……………………….. | ……………………….. |
|---|---|---|
| අධ්‍යක්ෂ/මුදල් | සභාපති | විධායක අධ්‍යක්ෂ |
| ඉඩම් ප්‍රතිසංස්කරණ | ඉඩම් ප්‍රතිසංස්කරණ | ඉඩම් ප්‍රතිසංස්කරණ |
| කොමිෂන් සභාව | කොමිෂන් සභාව | කොමිෂන් සභාව |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. } LP/F/LRC/1/FA/14/14

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2015 ජූලි 30 දින

සභාපති,

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 56 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමහ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථාකාලයේදී සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ ඉඩම් විකිණීමේදී ලැබෙන මුදලින් සියයට 40 ක් සංචිතයක් ලෙසත් සියයට 60 ක් වර්ෂයේ ආදායමක් ලෙසත් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය සභාව විසින් දිගින් දිගටම අනුගමනය කර තිබූ අතර විකුණනු ලබන ඉඩම්වල පිරිවැය හඳුනාගෙන ඒ සඳහා ගැලපීම් නොකිරීම තුළින් මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ප්‍රතිඵල නිවැරදි තත්ත්වයක් පෙන්නුම් කර නොතිබුණි. 2006 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා රු. 1,052,746,966 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. 131,194,166 ක් ඉඩම් විකිණීමෙන් ලද මුදල් ආදායම් ලෙස

දක්වා තිබුණි. මෙයට අතිරේකව සමාලෝචිත වර්ෂය තුළ රු. 1,226,950 කට විකුණු මෝටර් රථය සම්බන්ධයෙන්ද පිරිවැය හඳුනාගෙන ලාභය ගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. ඉඩම් ලේඛනයක් නොමැති වීම හා පැරණි වත්කම් පිළිබඳ තොරතුරු සභාව සතු නොවීම මෙසේ කටයුතු කිරීමට හේතු වූ බව කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් විගණනයට වාර්තා කර තිබුණි.

(ආ) උපචිත පදනම අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර තිබුණු නමුත් ගිණුම් පිළියෙල කිරීමේදී ලැබිය යුතු හා කලින් ලැබීම් පිළිවෙලින් රු. 49,845,316 ක් හා රු. 19,738,726 ක් ද ගෙවිය යුතු මුදල් රු. 28,567,470 ක් ද සැලකිල්ලට ගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂයේ මුදල් ගලාගෙන ඒම හා ගලාගෙන යාම පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කළ යුතු නමුත් මෝටර් රථ විකිණීමෙන් ලැබූ රු. 3,488,850 මුදල් ලැබීමක් ලෙස ඇතුළත් කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි වෙනුවෙන් වන්දි අවිනිශ්චිත අරමුදලක් ඇතිකර තිබූ අතර එම වන්දි වලට අදාළ ගෙවිය යුතු පොලිය වෙනුවෙන් වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද, වන්දි ගෙවීමේ දී ගෙවන පොලිය වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ දී රු. 42,483 ක් අරමුදලෙන් අඩුකර දක්වා තිබුණි. තවද ඉදිරියේ දී ගෙවිය යුතු පොලිය ඇස්තමේන්තුකර ඒ සඳහා ප්‍රතිපාදන සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 අසම්භාව්‍ය බැරකම්

--------------------

ඉඩමක අයිතිය ලබාගැනීම සඳහා සභාවට එරෙහිව පවරන ලද නඩුවක පැමිණිලිකරුවන් වෙත රු. 148,715,363 ක් ගෙවීමට 2009 වර්ෂයේදී අභියාචනාධිකරණය තීන්දුවක් ලබා දී තිබුණි. අදාළ පොළියද සමඟ ගෙවිය යුතු මුදල 2015 ජුනි 08 දින වන විට රු.මිලියන 200 ඉක්මවා තිබුණද මෙම වගකීම සඳහා ගිණුම්වල වෙන්කිරීමක් කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වන්දි අවිනිශ්චිත අදියර I හා II යටතේ ගෙවිය යුතු වන්දි මුදල රු. 223,235,616 ක් වුවද තක්සේරු හා වන්දි අංශයේ වාර්තා අනුව සභාව විසින් ප්‍රකාශකයින් වෙත ගෙවීමට තිබූ වන්දි මුදල පොළී සහිතව රු. 555,000,000 ක් විය. ඒ අනුව රු. 331,764,384 ක වෙනසක් නිරීක්ෂණය වූයෙන් මෙහි නිවැරදිතාවය තහවුරු කරගැනීමට විගණනයේදී නොහැකි විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව බදුකරුවන් 108 කට අදාළව ලැබිය යුතු බදු කුළී ආදායම රු. 61,154,808 ක් වුවද ආදායම් අංශයේ වාර්තා අනුව එය රු. 70,317,254 ක් වූයෙන් රු. 9,162,446 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ලැබිය යුතු බදු කුළී ගිණුමේ සඳහන් කර තිබූ බදුකරුවන් 43 දෙනෙකුට අදාළ රු. 26,760,244 ක ආදායමක් ආදායම් අංශයේ වාර්තාවල ඇතුළත්ව නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂය ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගණුදෙනුවල නිවැරදිතාව සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | ශේෂය (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| <u>ස්ථාවර වත්කම්</u> | | |
| ඉඩම් | 676,169,345 | පවරාගත් ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් උපලේඛන |
| ගොඩනැගිලි | 4,586,223 | වත්කම් ලේඛනය හා සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පරිගණක හා උපාංග | 7,185,162 | |
| ලී බඩු හා සවිකිරීම් | 857,543 | |
| මෝටර් රථ | 68,673,071 | |
| කාර්යාල උපකරණ | 20,310,316 | |
| සුභසාධන උපකරණ | 984,896 | |

<u>ණය හා අත්තිකාරම්</u>

| | | |
|---|---|---|
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 10,000 | ශේෂ සනාථ කිරීම |
| ඉන්ධන අත්තිකාරම් | 185,000 | |
| බොල්ණය ප්‍රතිපාදන | 8,270,356 | වෙන් කිරීම් සඳහා වූ පදනම |
| ලැබිය යුතු ආදායම් | 29,731,610 | ශේෂ සනාථ කිරීම් හා විස්තරාත්මක උපලේඛන |
| දැව විකිණීම් | 1,987,706 | දැව තක්සේරු කිරීමට අදාළ ලිපි ලේඛන |
| වන්දි අවිනිශ්චිත ගිණුම | 223,235,616 | විස්තරාත්මක උපලේඛන |
| ඉඩම් අත්පත් කරගැනීම් | 58,090,886 | |
| කුඹුරු ඉඩම් විකුණුම් | 271,896 | |
| බදු දී ඇති ඉඩම් සඳහා ලැබිය යුතු ප්‍රමාද ගාස්තු | 9,689,132 | විස්තරාත්මක උපලේඛන |

**2.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ වර්ෂ 12 කට වැඩි එකතුව රු. 2,135,747,805 ක් වූ වෙළඳ ණයගැති ශේෂ සහ වර්ෂ 15 කට වැඩි එකතුව රු. 2,921,575 ක් වූ විවිධ ණයගැති ශේෂ සඳහා අඩමාන ණය වශයෙන් රු. 8,270,356 ක් වෙන්කර තිබුණද එම ණය අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද සභාව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ මූල්‍ය ප්‍රකාශනවල රු. 2,135,625,366 ක් රාජ්‍ය ආයතන 09 කින් ලැබිය යුතු ලෙස දක්වා තිබුණද එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවල සභාවට නිරවුල් කළ යුතු ශේෂයන් නොපැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) සභාවේ සේවකයන් 46 දෙනෙකුගෙන් 2010 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති එකතුව රු. 718,656 ක් වූ ණය ශේෂයෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් බදු අත්තිකාරම් ගිණුමේ රු. 13,840,850 ක ශේෂයක් පැවති අතර එයින් රු. 11,215,850 ක් වර්ෂ 09 කට වැඩි කාලයක් ද රු. 2,625,000 ක් වර්ෂ 03 සිට වර්ෂ 08 දක්වා පැරණි ඒවාද විය. මෙම ශේෂ නිරවුල් කිරීමට සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත | |
| 45 (i) (අ) (iii) වගන්ති | කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය සඳහා රේඛීය අමාත්‍යාංශය නියෝජනය කරන සාමාජිකයකු පත් කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| 11 වන වගන්තිය | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු රු.160,000,000 ක් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාගේ සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | සභාව එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි වී නොතිබීම හේතුවෙන් ඒ මත සමාලෝචිත වර්ෂයේදී අයවිය යුතු බදු ආදායම වන රු.26,827,886 ක් රජයට අහිමි වී තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| II පරිච්ඡේදය 13.3 වගන්තිය | අධ්‍යක්ෂ මුදල් තනතුර වර්ෂ 07 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවති අතර 2015 ජුනි 15 දින දක්වාම එම තනතුර පිරවීමට කටයුතු කර නොතිබුණි. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 134 (3) | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත එවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) | * අතුරු අග්‍රිම දෙන ලද කාර්ය නිම කළ විගසම පියවිය යුතු වුවත් අවස්ථා 34 කදී සැලකිය යුතු කාල පමාවකින් පසුව අත්තිකාරම් පියවා තිබුණි.<br>* එක් අවස්ථාවකදී නිලධාරියෙකුට ලබා දිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු. 20,000 ක් වුවද අවස්ථා 3 කදී එම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371 (4) | අවස්ථා 19 කදී දැරීමට සිදුවන වියදම පිළිබඳව නිසි පුරෝකථනයකින් තොරව අත්තිකාරම් ලබාගෙන තිබුණු අතර ලබාගත් අත්තිකාරම් මුදලින් ඉතිරිය සියයට 27 සිට සියයට 92 දක්වා පරාසයක පැවතුණි. |
| (iv) මුදල් රෙගුලාසි 757 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඊ) **1978** දෙසැම්බර් **19** දිනැති අංක **842** දරන **භාණ්ඩාගාර චක්‍රලේඛය.** | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 87,130,484 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 97,096,038 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,965,554 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සැසඳීමේදී ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි පොළී ආදායම රු. 15,784,616 කින් පහළ යාම හා කාර්යමණ්ඩල පිරිවැය රු. 23,509,742 කින් ඉහළයාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 22:1 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජංගම වත්කම්වලින් අයිතම 24 කට අදාළ රු. 2,158,312,885 ක් හෙවත් සියයට 90 ක් වර්ෂ 12 ඉක්මවූ හා අයකර ගැනීම අවිනිශ්චිත තත්වයක පවතින ලැබිය යුතු ණය ශේෂයන්ගෙන් සමන්විත වූ අතර එය මුළු වත්කම්වලින් සියයට 54 ක් විය. ඒ අනුව සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළින් ආයතනයේ වත්කම් හා බැරකම් සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ තථ්‍ය තත්ත්වයක් පිළිබිඹු කරන බවට නිශ්වය කළ නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දැහි වටිනාකම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 15,104,068 කින් ඉහළ ගොස් තිබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 20 ක වැඩිවීමක් විය.

3.3 සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවට එරෙහිව හා සභාව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව 448 ක් වූ අතර ඒ සඳහා සභාව විසින් වැයකර තිබූ නීති වියදම රු. 4,061,224 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී වන්දි මුදල් හිමිකම සම්බන්ධයෙන් සභාවට එරෙහිව අධිකරණයේ නඩු 14 ක්ද, ඉඩම් අත්පත් කරගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත කළ අභියාචනා 07 ක්ද විභාග වෙමින් පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාකාරකම් 10 ක් ක්‍රියාවට නංවා නොතිබුණු අතර ක්‍රියාකාරකම් 19 ක ප්‍රගතිය සියයට 1 ක සිට සියයට 50 ක් දක්වා අඩු පරාසයක පැවතුණු බවත් නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාව විසින් ප්‍රකාශකයින් සඳහා ගෙවිය යුතු වන්දි පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාල ගැසට් නිවේදන පල කරන ලද හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 110 කින් 106 කට හිමිකම් තහවුරු වී නොතිබුණි. තවද භුක්තිය භාරගැනීමේ අඩුපාඩු නිසා කටයුතු නොකර පැවති ලිපිගොනු සංඛ්‍යාව 35 ක් විය.

(ආ) සභාවට පැවරී ඇති ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් තවදුරටත් ලිපිගොනු 575 කට ආසන්න ප්‍රමාණයකට තොරතුරු ලබාගත යුතුව තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 33 වගන්තිය ප්‍රකාරව හිමිකම් තහවුරු වී නොමැති හෝ වන්දි ගෙවීමට නොහැකි අවස්ථාවක ඒ වන්දිය හිමි තැනැත්තා හෝ තැනැත්තන්ට ගෙවීම සඳහා සිවිල් අධිකරණ බලය ඇති යම් නිසි අධිකරණයක අදාල වන්දි මුදල තැන්පත් කළ යුතු නමුත් එසේ කටයුතු කිරීමට තිබූ ලිපිගොනු අතරින් ලිපිගොනු 60 කට ආසන්න ප්‍රමාණයක් සඳහා මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පසුගිය වර්ෂ 5 තුළදී වන්දි අවිනිශ්චිත I ගිණුමෙන් වන්දි ගෙවා ඇති ආකාරය පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | වන්දි අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය<br>රු. | වන්දි අවිනිශ්චිත ගිණුමේ අවසාන ශේෂය<br>රු. | ගෙවා ඇති මුදල<br>රු. | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 2010 | 140,769,719 | 138,136,888 | 2,632,831 | 1.87 |
| 2011 | 138,136,888 | 131,287,683 | 6,849,205 | 4.96 |
| 2012 | 131,287,683 | 126,561,891 | 4,725,793 | 3.6 |
| 2013 | 126,561,891 | 119,139,915 | 7,421,976 | 5.86 |
| 2014 | 119,139,915 | 113,276,123 | 5,863,792 | 4.92 |

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරුණු ඉඩම් සඳහා සභාව විසින් වන්දි ගෙවිය යුතු වුවද සභාවේ පසුගිය වර්ෂ 5 ක කාර්ය සාධනය සලකා බැලීමේදී වන්දි හා අවිනිශ්චිත I ගිණුමෙන් වර්ෂ 05 ක් තුළ වන්දි මුදල් නිරවුල් කිරීම සියයට 1.87 ත් සියයට 5.86 ත් දක්වා වූ අඩු පරාසයක පැවති බව නිරීක්ෂණය විය. තවද වන්දි අවිනිශ්චිත II ගිණුමෙන් වන්දි නිරවුල් කිරීමක් සිදුවී නොතිබුණු අතර රු. 109,959,493 ක් වූ එහි ශේෂය වර්ෂ ගණනාවක් පුරා නොවෙනස්ව පැවතුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ ඉඩම් විකුණුම් ආදායමින් සියයට 60 ක් මෙහෙයුම් වියදම් ලෙසද සියයට 40 ක් සංචිත ලෙසද වෙන් කිරීම සඳහා වූ කොමිෂන් සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) කොළඹ, කුරුණෑගල, පුත්තලම යන දිස්ත්‍රික්කවල සභාවේ සෘජු පාලනය යටතේ පවතින අක්කර 150,000 කට ආසන්න පොල් ඉඩම් ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂයේ පොල් ආදායම් ලෙස රු. 300,653 ක් ලැබී තිබුණි. එම පොල් ආදායම සමස්ත ආදායමෙන් සියයට 0.09 කටත් වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට තක්සේරු ගාස්තු අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 23,361,248 ක් වුවද තක්සේරු ගාස්තු ලෙස ගෙවා ඇති මුදල රු. 3,302,303 ක් පමණක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මාසික ආදායම රු. 60,000 සීමාව නොඉක්මවන දිස්ත්‍රික් 04 ක් වාර්තා වී තිබුණු අතර තවත් දිස්ත්‍රික් 04 ක සමහර මාසයන් සඳහා කිසිදු ආදායමක් වාර්තා වී නොතිබුණි. තවද ත්‍රිකුණාමලය හා අනුරාධපුර දිස්ත්‍රික්කවලින් පිළිවෙලින් රු. 300,000 ක ප්‍රවේණි ආදායමක් හා රු. 19,300 ක බදු ආදායමක් වශයෙන් අඩු ආදායමක් ලැබී තිබුණු අතර එම කාර්යාල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

බාහිර පාර්ශවයන් සහ සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 402 දෙනෙකු විසින් වර්ෂ 01 සිට වර්ෂ 07 කාලයක සිට රු. 4,888,492 ක් ද වර්ෂ 08 ඉක්මවූ රු. 6,899,500 ක්ද ඉඩම් ලබාගැනීම සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවීම් කර තිබුණු අතර ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය මගින් සභා සේවකයන්ට තක්සේරු වටිනාකමට ඉඩම් ලබාදෙන ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ ඉල්ලීමකට ලද අනුමැතියක් මත එසේ ඉඩම් ලබාදීමට අත්තිකාරම් ලබාගැනීම මතභේදයට තුඩු දෙන ගනුදෙනුවක් විය. තවද සමහර ඉඩම් ඉල්ලුම්කරුවන්ගෙන් ඉඩම් කැබලි 01කට වඩා ලබාදීමට අත්තිකාරම් ලබාගෙන තිබුණු අවස්ථා 54 ක්ද නිරීක්ෂණය විය.

## 5.2 අභ්‍යන්තර විගණනය

2014 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව මුදල් අංශය, ඉඩම් පැවරීම් අංශය හා සියළුම දිස්ත්‍රික් කාර්යාලවල ආදායම් වියදම් වාර්තා හා මාසික ගිණුම් විස්තර පිළිබඳ පරීක්ෂණයන් සිදුකිරීමට සැලසුම් කර තිබුණද එම ක්ෂේත්‍රයන් ආවරණය කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

2014 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් පරීක්ෂාවේදී ආදායමෙහි සියයට 13 ක සිට සියයට 129 ක් දක්වා විචලනයන් හා වියදමෙහි සියයට 1 ක සිට සියයට 2,950 ක් දක්වාද සැලකිය යුතු විචලනයන් අනාවරණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීමට පෞද්ගලික ආයතනයකට 2002 වර්ෂයේදී ගෙවා තිබුණු රු. 17,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් පැවැත්වෙන බවත් මෙවැනි ආයතනයක් නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව සභාවේ විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) නීති කටයුතු.

(ආ) ණයගැති පාලනය.

(ඇ) ආයෝජන දේපල.

(ඈ) ඉඩම් බදුදීම.

(ඉ) ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවීම.

(ඊ) වාහන පාලනය.

(උ) මුදල් ලැබීම්.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

O/C

IA /G/406/2015 LP/F/LRC/I/FA/14/14 2015.06.

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) කොමිෂන් සභාව ආරම්භ කරන අවස්ථාවේදී අප වෙත පවරා ගන්නා ලද ඉඩම්වලට අදාළ පිරිවැය කොපමණද යන්න සඳහන් කර ඉඩම් ලේඛණයක් අප වෙත නොමැති බැවින් මෙම ගැටළුව පැන නැගී ඇත. දැනට මේ සම්බන්ධව මූලික පියවර ලෙස ඉඩම් ලේඛණය සකස් කරමින් පවතී. ඒ අනුව අප වෙත පැවරුණු ඉඩම් ප්‍රමාණය දැනට නිවැරදිව ඇතුලත් කර ඇති අතර, ඉදිරියේදී එය සම්පූර්ණ වූ පසු පවරා ගන්නා ලද ඉඩම්වලට අදාළව ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු වන්දි මුදල පිරිවැය ලෙස සලකා ඉඩම් ගැලපුම සිදු කිරීමට බලාපොරොත්තු වේ. මේ අනුව ඉඩම් ලේඛණය යාවත්කාලීන කර අවසන් වන තෙක් මේ සම්බන්ධව ක්‍රියා කල නොහැකි බව දන්වමි.

වර්ෂය තුළ විකුණන ලද වාහන ඉතා පැරණි ඒවා බැවින් ඒවාට අදාළ පිරිවැය පිළිබඳ තොරතුරු අප වෙත නොමැත. 2014 වසර තුළ විකුණන ලද වාහන වෙනුවෙන් විකුණුම් වටිනාකම රු. 1,226,950/- කි.



62

මෙහි පිරිවැය හෝ සමුච්චිත ක්ෂය කොපමණද යන්න පිළිබඳ තොරතුරු නොමැති බැවින් එහි ලාභය හෝ අලාභය ගණනය කිරීමට නොහැකි විය. මෙම වාහන 1990 ගණන්වල අප වෙත ලැබිය යුතු මුදල් වෙනුවෙන් පට හා සේද ආයතනය පාවිච්චි කර අප වෙත ලැබුණු පරණ වාහන වේ. ඒ අනුව මෙම මෝටර් රථය විකිණීමෙන් ලද සම්පූර්ණ මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කර ඇත. එම වසර තුළ විකුණන ලද KH 9751 දරණ රථය සම්බන්ධයෙන් නිවැරදිව ගිණුම් තබා ඇති බවද සටහන් කරමි.

(ආ) (i) ආදායම් අංශයේ අධ්‍යක්ෂ, රත්නපුර කාර්යාලයේ සහ ප්‍රධාන කාර්යාලයේ ආදායම් අංශය යන අංශ දෙකේම රාජකාරී ඉටු කරන බැවින් 2014.12.31 දිනට ලැබිය යුතු ආදායම පිළිබඳ වාර්තා ගිණුම් අංශය වෙත නියමිත දිනට ලබා දීමට නොහැකි වී ඇත. ඒ අනුව ගිණුම් වාර්තාවලට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට නොහැකි විය. දැනට එම වාර්තා සකස් කර අවසන් බැවින් සංශෝධිත ගිණුම් වාර්තා සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි.

(ii) ගිණුම් වාර්තා සංශෝධනය කිරීමේදී මෙම අධිභාර මුදල ද ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට සටහන් කර ගනිමි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 1972 සිට අප විසින් විවිධ ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු ද කරමින් පරිහරණය කරනු ලබන මෙම ගොඩනැගිල්ල සඳහා මුලදී ගෙවිය යුතු බදු කුලී රු. 1,400/- රු. 14,000/- වැනි ඉතා අඩු අගයක සිට එකවර රු. 280,000/-, රු. 330,000/- වැනි මුදලකට වැඩිකර ඇත. එසේම කොමිෂන් සභාව විසින් මිලියන 10 කට වැඩි වියදමක් දරා ගොඩනැගිලි ද සාදා ඇත. එබැවින් එකවර විශාල ප්‍රමාණයකින් බදු මුදල් වැඩි කිරීම අප ආයතනයට දැරීමට අපහසු බැවින් ඉහත කී හේතූන් මත එම මුදල සාධාරණ ලෙස අඩු කිරීම සහ ගෙවිය යුතු හිග මුදල් වාරික වශයෙන් සහන කාලයක් තුළ ගෙවීමේ හැකියාව ලබා ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමග මේ වන විට සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර. දැනටමත් එය සාකච්ඡා මට්ටමේම පවතී. ඒ අනුව 2012 ට පෙර වැඩි කරන ලද මුදල් ගිණුම්වලට ගැලපීම් කර නොමැති අතර. 2012 ට පසුව නියමිත කුලිය වේලාවට හිගයකින් තොරව අද දක්වා ගෙවනු ලැබේ. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් තීරණයක් ගත් පසු ගිණුම්වලට ගැලපීම් කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ආ) එම්වින් නැචුරල් සිලෝන් පුද්ගලික සමාගමෙන් ලද රු. 21750/- ක මුදල සටහනට ඇතුලත් නොවීම මෙම වෙනසට හේතු වී ඇත. මෙය ගිණුම් වාර්තාවල දැනටමත් නිවැරදි කර ඇති බව දන්වමි. 2014 වර්ෂයට අදාලව ආදායම ගැලපීම සිදු නොකිරීම මෙයට හේතු වී ඇත. මෙය ගිණුම් සංශෝධනය කිරීමේදී නිවැරදි කරන බව සටහන් කරමි.

(ඇ) සංශෝධිත ගිණුම් වාර්තා සකස් කිරීමේදී ගිණුම් ගත කරන බව සටහන් කරමි.

(ඈ) ස්ථාවර තැන්පතු

(i) සහ(ii) LP/F/LRC/02/2014/03 හි විගණන විමසුමෙහි ලබා දී ඇති පිළිතුරට අනුව නිවැරදි කර ගැනීම් සිදු කරන බව දන්වමි.

(ඉ) භාණ්ඩාගාර බිල්පත්

මෙම තැන්පතුවට අදාල ලැබිය යුතු ආයෝජන පොලිය ගණනය කිරීමේදී දින 01 ක වෙනස මත මෙම පොලිය වෙනස් වී ඇත.

(ඊ) ස්ථාවර වත්කම්

(i) වර්ෂය තුල විකුණන ලද වත්කම් ඉතා පැරණි ඒවා බැවින් ඒවාට අදාල පිරිවැය පිලිබඳ තොරතුරු අප වෙත නොමැති බැවින් එහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ගලපා ලාභය හෝ අලාභය ගණනය කිරීමට නොහැකි වී ඇත. 2014 වසර තුල විකුණන ලද වාහන 1990 ගණන්වල අප වෙත ලැබිය යුතු මුදල් වෙනුවෙන් පට හා සේද ආයතනය පාවිච්චි කර අප වෙත ලද වාහන වේ. එහි ගැණුම් මිල කොපමණද යන්න සඳහන් කර නොමැති අතර, සොයා ගැනීමේ හැකියාවක් ද නොපවතී. ඒ අනුව මෝටර් රථය විකිණීමෙන් ලද සම්පූර්ණ මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කර ඇත.

(ii) පරිගණක හා උපාංග ක්ෂය කිරීමේදී හීන වන ක්ෂය ක්‍රමයට ක්ෂය කළ යුතු වුවත්, පිරිවැය මත ක්ෂය ගණනය කිරීම මත ක්ෂය වැඩි වී ඇත. එය නිවැරදි කිරීමට සටහන් කළ අතර, කාර්යාල උපකරණ ක්ෂය නිවැරදි බව සඳහන් කරමි.

(iii) රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය පවත්වා ගෙන යන ගොඩනැගිල්ල සහ ලිදුල සංචාරක බංගලාව තක්සේරු කර අදාළ වත්කම්වල පිරිවැය ගිණුම්වලට ගැලපිය යුතුයි. මෙහිදී වර්තමාන වටිනාකම හා අතීත පිරිවැය මත දත්ත ගිණුම් ගත කල නොහැකි බැවින් ඒ සම්බන්ධ බාහිර විගණන අංශයේ ද උපදෙස් ලබා ගන්නා ලදී. ඒ අනුව එම වත්කම් ගිණුම් ගත නොකරන ලද අතර. අදාළ වියදම් ද ප්‍රාග්ධනීත නොකරන ලදී. ශේෂ පත්‍රය තුල මෙම වියදම පමණක් අදාළ ව්‍යාපෘතිය යටතේ පෙන්නුම් කල හැකි බැවින් එය එසේ නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(iv) මෙය ගිණුම් වාර්තාවල නිවැරදි කර ගැනීමට සටහන් කර ගන්නා ලදී.

(උ) ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙනුවෙන් දෙසැම්බර් මසට හිමි කුලිය දෙසැම්බර් මසම ගෙවා ඇත. මෙය නිවැරදි කර ගැනීමට සටහන් කර ගන්නා ලදී.

(ඌ) ගෙවිය යුතු කල්බදු කුලී

--------------------

(i) ගිණුම් වාර්තා හා බැංකු සනාථ ලිපි අනුව මෙය නිවැරදි වේ. අප විසින් පෙර වැඩ සඳහා පිලියෙල කර ඇති ලේඛණය පදනම් කර ගෙන මෙය වැරදි බවට විගණන අංශය මගින් පෙන්වා දී ඇත. මෙය නිවැරදි නොවේ.

(ii) මෙම වෙනස ප්‍රාග්ධනීත අගයෙන් අඩුකර ගිණුම් වාර්තා සංශෝධනය කරන බව දන්වමි.

(iii) මෙම වෙනසට බදු අනුපාතය අඩුවීමද බලපා ඇති අතර. එය ගිණුම්වලට ගලපා නිවැරදි කරන බව සටහන් කරමි.

(එ) හදිසි අවස්ථා වියදම යටතේ පෙන්නුම් කර ඇති සංග්‍රහ වියදම හා ප්‍රවාහන වියදම හදිසි ඔප්පු උත්සව සඳහා දරණ ලද වියදම් වේ. සමාන්‍යයෙන් ආතනයේ මාසිකව පොදුවේ දරණ වියදම සංග්‍රහ වියදම් යටතේ දැක්වූවත් මෙම සංග්‍රහ වියදම් නිතර ඇති නොවන බැවින් මෙය හදිසි අවස්ථා ගිණුමේ ගිණුම් ගත කරන ලදී. මේ අනුව හදිසි අවස්ථා වියදම් ගිණුමේ දැක්වෙන සංග්‍රහ වියදම්, ප්‍රවාහන වියදම්, ගොඩනැගිලි නඩත්තු හා කාර්යාල උපාංග නඩත්තු වියදම් අදාළ ගිණුම්වලට ඇතුලත් කර මූල්‍ය වාර්තා සංශෝධනය කරන බව දැනුම් දෙමි



65

(ඒ) සේවකයින් 11 දෙනෙකු සඳහා නොව මෙය 10 දෙනෙකු සඳහා විය යුතු අතර. එය නිවැරදිව ගිණුම්වල ගලපා ඇත.

(ඔ) ඉඩම් තක්සේරු ගාස්තු

-------------------

(i) මෙම මුදල ලෙජරයට පිටපත් කිරීමේදී වරද සිදු වී ඇත. මෙය ලෙජරයට අදාලව පමණක් නිවැරදි කර ගැනිමට උපදෙස් ලබා දී ඇත. (මෙය මාසිකව ගනු ලබන ශේෂ පිරික්සුමේ සහ අවසන් ශේෂ පිරික්සුමේ ශේෂය නිවැරදිව ඇතුලත් කර අවසන් ගිණුම් වලට ගෙන ඇත.) ඒ අනුව අවසන් ගිණුම් නිවැරදි වේ.

(ii) මෙය නීති වියදමක් ලෙස ගිණුම් ගත කර ඇත. නිවැරදි කර ගැනිමට සටහන් කර ගන්නා ලදී.

(ඕ) ගිණුම සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන විට මෙය නිවැරදි කිරිමට සටහන් කරන ලදී.

(ක) මෙය අනියම් පදනම මත බඳවා ගත් සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු වැටුප් වේ. දැනටමත් මෙම මුදල් ගෙවා ඇති අතර. මෙය සංශෝධිත ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ග) වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් ආයතනයට අය කර ගත යුතු රු. 48,312. 56 ක අර්ථසාධක අරමුදල් වැටුප් හා වේතන ගිණුමෙන් ඉවත් කිරිමට යෙදිය යුතු ජර්නල් සටහන මාරුකර යෙදීම මත මෙම මුදල දෙගුණයක් වී ඇත. මෙය නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ච) ගාල්ල - නොවැම්බර් රු. 18,600/-

මෙම නීති ගාස්තු වැරදීමකින් තක්සේරු ගාස්තු ගිණුමට පිටපත් කර ඇත. එය නිවැරදි කර ගැනීමට සටහන් කර ගන්නා ලදී.

ගම්පහ නොවැම්බර් රු. 10,500/

මෙම නීති ගාස්තු මැණුම් ගාස්තු ලෙස ගිණුම් ගත වී ඇත. එය සංශෝධනය කර ගැනීමට සටහන් කර ගන්නා ලදී

මාතර - දෙසැම්බර්

බදු ආදායම ගිණුමට පිටපත් වී ඇත. මෙය නිවැරදි කර ගැනීමට සටහන් කර ගන්නා ලදී.

(ට) මෙය ලෙජර් ගිණුම් හා ගිණුම් වාර්තා විස්තරාත්මක ලෙස පරීක්ෂා කර නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

2.2.3 අසම්භාව්‍ය බැරකම්

කොමිෂන් සභාව සතුව පවතින නඩු ප්‍රමාණය හා ඒ සඳහා ඉදිරියේදී ගෙවිය යුතු වන වන්දි ප්‍රමාණය පිළිබඳව අසම්භාව්‍ය බැරකමක් සභාව සතුව පැවතියද. එම නඩු කුමන අවස්ථාවක අවසන් වේ ද? ඒ සඳහා කොපමණ ප්‍රමාණයක් වන්දි ගෙවිය යුතුද ? යන්න පිළිබඳ ඇස්තමේන්තු කල නොහැකි බැවින් . කොමිෂන් සභාව සතුව පවතින නඩු ප්‍රමාණය පමණක් මූල්‍ය ප්‍රකාශනවලට සටහනක් වශයෙන් ඉදිරිපත් කරන ලදී. මෙහි සඳහන් විශේෂ නඩුව සම්බන්ධයෙන් ගෙවීම් වලට අදාළ විකල්පයන් පිළිබඳ සාකච්ඡා කරමින් පවතින අතර. ඒ පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත විශේෂ අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇත. ඒ අනුව පියවර ගැනීමට නියමිතව පවතී.

2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

(අ) දළ වශයෙන් මුළු වන්දි මුදල් හා පොලී මුදල සහිතව රුපියල් මිලියන 555 ක් වුවත් මෙය නිවැරදිම සංඛ්‍යාවක් නොවන බව පෙනේ. විවිධ වකවානු වලදී කර ඇති තක්සේරු අනුව මෙය වෙනස් අගයක් පෙන්නුම් කරන අතර. මේ සම්බන්ධව දිගින් දිගටම විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට ලක් කරමින් පවතී. ඒ අනුව වන්දි ගෙවිය යුතු නිවැරදි ලිපිගොනු සංඛ්‍යාව හඳුනාගෙන ගෙවිය යුතු වන්දි ප්‍රමාණය කොපමණද යන්න තවමත් නිශ්චිතවම හඳුනාගෙන නොමැති අතර. එම කාර්යය තවදුරටත් කෙරෙමින් පවතී.

(ආ) දෙසැම්බර් මස ඉඩම් විකුණුම් ආදායම රු. 99, 856/- ක මුදල බදු ආදායම් ලෙස ගිණුම් ගත වී ඇත. එය නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ඇ) LP/F/LRC/02/2014/10 හි (06) සහ (07) හි සඳහන් පරිදි ගිණුම සංශෝධනය කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ඇ) සහ (ඉ)- 2014.12.31 දිනට ලැබිය යුතු බදු ආදායම් අවසන් ගිණුම්වල නොගැළපීම මත මෙම වෙනස්කම සිදු වී ඇත. එය ගිණුම් සංශෝධනය කිරීමේදී ගැලපීම් කිරීමට සටහන් කර ගන්නා ලදී.

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

**ස්ථාවර වත්කම්**

ඉඩම් - ඉඩම් ලේඛණය යාවත්කාලීන කිරීමෙන් පසු අදාළ පියවර ගැනීමට සටහන් කර ගතිමි.

ගොඩනැගිලි- මොණරාගල දිස්ත්‍රික් කාර්යාලීය ගොඩනැගිලි වටිනාකම, ලිඳුල බංගලාව, සහ රත්නපුර ෆාම්ගාඩ්න් වත්ත වෙනුවෙන් දරනු ලැබූ සමහරක් ප්‍රාග්ධණ වියදම් ද ඇතුළුව ගිණුම්වලට ඇතුලත් කර ඇත.

| | |
|---|---|
| පරිගණක හා උපාංග<br>ලීබඩු හා සවිකිරිම්<br>මෝටර්රථ<br>කාර්යාල උපකරණ<br>සුහසාධක උපකරණ | - 2014.12.31 දිනට අදාළ තොග සමීක්ෂණ කටයුතු 90% ක් පමණ අවසන් කර දැනට පරිගණක ගත කරමින් පවතී. කාර්ය මණ්ඩලයේ ඌනතාවය මත අවසන් කල නොහැකි වූ බැවින් ඉදිරි සති දෙක තුල අදාළ ලිපිගොනු විගණන අංශය වෙත භාර දෙන බව දන්වමි. |

ණය හා අත්තිකාරම්-

| | |
|---|---|
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය<br>ලෝහෝර් ආර්යා අරමුදල<br>ඉන්ධන අත්තිකාරම්<br>මෝටර් රථ අළුත්වැඩියා සඳහා අත්තිකාරම් | - ශේෂ සනාථ කර පිලිතුර සෘජුවම විගණකාධිපති වෙත ලැබෙන ලෙසට ලිපි මගින් අදාළ අංශ වෙත දැනුම් දී ඇත. |
| බොල්ණය ප්‍රතිපාදන | වසර 10 කට වැඩි කාලයක් තුල මෙය ගිණුම්වල පෙන්නුම් කරන අතර. කෙසේ ගණනය කර ඇද්ද යන්න පිළිබඳ විස්තර සොයා ගැනීමට නොහැකිව පවතී. |
| ලැබිය යුතු ආදායම් | මෙම ආදායම සනාථ වී ඇති ආකාරය පිළිබඳ තවම තොරතුරු සොයා ගත නොහැකි බැවින් ඒ පිළිබඳ පසුව විස්තර ඉදිරිපත් කරමි. |

| | | |
|---|---|---|
| දැව විකිණීම් | - | අදාළ ලිපි ගොනුවල විස්තර ඉදිරිපත් කර ඇත. |
| චන්දි අවිනිශ්චිත ගිණුම<br>ඉඩම් අත්පත් කර ගැනීම්<br>කුඹුරු ඉඩම් විකුණුම් | - | මේ සම්බන්ධ විස්තර වෙන වෙනම ලිපිගොනු විශාල ප්‍රමාණයක ඇතුලත් කර ඇත. |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සහ (ආ) - දිගු කාලයක සිට සභාවේ ජංගම වත්කම්වල නිරූපනය කරන වෙළඳ හා ලැබිය යුතු මුදල මිලියන 2.135 කි. මෙම මුදල් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු වේ. ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය යන රාජ්‍ය ආයතනවලට මෙම මුදල් ගෙවන ලෙසට දන්වා ඇත.

වැවිලි සංස්ථාව ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගත් ඉඩම නැවත එම ආයතනය විසින් ජාතික පශු සම්පත් මණ්ඩලය , පොල් සංවර්ධන මණ්ඩලය, කජු සංස්ථාව වැනි ආයතනවලට බදු පදනම මත ලබා දී ඇති අතර, එම ආයතනවල ප්‍රධානීන් කැඳවා සාකච්ඡා කරන ලදී. එහිදී එම ආයතනවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීමත්, නිවැරදි සංඛ්‍යා ලේඛණ නොමැති වීමත් යන ගැටළු ඉදිරිපත් විය.

මෙම ගැටළු විසඳීම සඳහා ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් භාණ්ඩාගාර නිලධාරීන් ද කැඳවා සාකච්ඡා කරන ලෙසට ඉල්ලීමක් ද කළ අතර, ලේකම්තුමා විසින් එක් එක් ආයතනයෙන් ලැබිය යුතු මුදල් පිළිබඳ විස්තර ඉල්ලා තිබුණු අතර, අදාල ලිපිගොනු අනුව එකී විස්තරද සපයා ඇත. මේ අනුව මෙම ලැබිය යුතු මුදල් ලබා ගැනීම සම්බන්ධව විවිධ අවස්ථාවල උත්සාහ ගනු ලැබුවද, තනිව ගත්කල අප කොමිසන් සභාවට පමණක් විසඳා ගත හැකි ප්‍රශ්නයක් නොවන බවත් මෙය පොදුවේ ප්‍රතිපත්තිමය තීරණයක සිට මහා භාණ්ඩාගාරය මැදිහත්වීම මත විසඳා ගත යුතුව පවතින්නකි.

මැතිවරණ ඉඩම, ප්‍රතිසංස්කරණ සමුපකාර සමිති සහ විවිධ සේවා සමුපකාර සමිති දැනට ඇවර කර ඇති බවට වරින්වර අප වෙත දැනුම් දී ඇත.



69

ඉඩම් අමාත්‍යාංශයේ අය විය යුතු මුදල් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නඩුවක් පවතින අතර, එය අවසන් වනතුරු ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නොහැකි වී ඇත.

ජාතික කඩදාසි සංස්ථාවෙහි දිරාගිය ඉවත් කරන ලද කඩදාසි සැපයීම වෙනුවෙන් එම ආයතනයෙන් ලැබිය යුතු මුදල් වේ.

පොදුවේ ගත්කල සෑම ආයතනයකින්ම මෙම මුදල් අය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරුවද, එසේ අය කර ගැනීමට නොහැකි වීම මත මෙම මුදල අය විය යුතු බවට ගිණුම් වාර්තාවල පෙන්වීමට සිදු වී ඇත.

(ඇ) ගොඩනැගිල්ල ඉදිකර ගැනීමේ යෝජනාව ඇති වූ කාල වකවානුවේ සිටම ගොඩනැගිල්ල ඉදිකර ගැනීම දිස්ත්‍රික් ලේකම් හරහා සිදු කර ගැනීම තුලින් එහි වගකීම දිස්ත්‍රික් ලේකම් වෙත පැවරෙන බැවින්ද, ඔවුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු වන බැවින් ද දිස්ත්‍රික් ලේකම් හරහා ගොඩනැගිල්ල ඉදිකර ගැනීම වඩාත් සුදුසුයැයි අවස්ථා කිහිපයකදීම පැවති සාකච්ජා වාරයන්හිදී සාකච්ජා කෙරුණි.

කොමිපත් සභාවේදී ද ඒ බවට සාකච්ජා වූ බව හිටපු සභාපතිතුමා විසින් ද ප්‍රකාශ කරන ලදී. කොමිපත් සභා තීරණය යතුරුලියනය කිරීමේදී ප්‍රමාද දෝෂයකින් 'දිස්ත්‍රික් ලේකම්' යන්න වෙනුවට 'ප්‍රාදේශීය ලේකම්' යන්න ඇතුලත් වී ඇති බවට පසුව කරුණු අනාවරණය වූයෙන් ගොඩනැගිල්ල ඉදිකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකගතාවය ලබා ගැනීමෙන් පසුව නැවත කොමිපත් සභාවට ඉදිරිපත් කර පෙර ලබා ගනු ලැබූ තීරණය සංශෝධනය කර ගැනීමට කටයුතු කර ඇත.

(ඈ) ඉඩම් බදු අත්තිකාරම්

ඉඩම් බදු අත්තිකාරම් තුල පෙන්නුම් කරනු ලබන්නේ 2002 -2004 කාලය තුල ලබා ගත් අත්තිකාරම් මුදල් වේ. මෙම ඉඩම් ගණුදෙනුව අමාත්‍ය මණ්ඩල තීරණය මගින් තහනම් කර ඇත. මෙයට සම්බන්ධ ආයතන හෝ පුද්ගලයින් විසින් නැවත පවරා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව කොමිපත් සභාව මගින් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන්නට යෙදුනි. එහිදී අමාත්‍ය මණ්ඩලය විසින් තහනම් කරනු ලැබ මෙම ඉඩම් ගණුදෙනුවට අයත් ඉඩම නැවත පවරා දීමට ක්‍රියා කරන්නේ නම්, ඒ සඳහා සංශෝධන සහිත සැකිනට පත්‍රිකාවක් සකස් කර ඉදිරිපත් කල යුතු බව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දැනුම් දී ඇත. ඒ අනුව අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කලද, ඒ සඳහා මෙතෙක් තීරණයක් ගෙන නැත.

මේ යටතේ සංවර්ධනය කල යුතු ඉඩම් බදු පදනම යටතේ ලබා දීමටත්. සංවර්ධනය නොකළ ඉඩම් නැවත පවරා ගැනීමටත් ක්‍රියා කරමින් පවතී. මෙයට අමතරව අත්තිකාරම් ආපසු ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරන පුද්ගලයින් හා ආයතන වෙත එම මුදල කොම්පැනි සභාවේදී අනුමැතිය ලබාගෙන නිදහස් කරනු ලැබේ. අමාත්‍ය මණ්ඩල නිශ්චිත තීරණයක් ලැබෙන තෙක් මෙය නිරවුල් කිරීමේ හැකියාවක් නොපවතී.

(ඉ)(i) සහ (ii) - 2014.12.31 දිනට දක්වා ඇති ඉඩම් අත්තිකාරම් ලේඛණයේ පුද්ගලයින්ගෙන් බහුතරයක් 2002 - 2004 දක්වා කාලයට අයත් වේ. මේ කාල සීමාවට අයත් ගණුදෙනු අමාත්‍ය මණ්ඩල විසින් අත්හිටුවා ඇත. එම නිසා එම අත්තිකාරම් අදාළ පුද්ගලයින් ඉල්ලුම් නොකරන්නේ නම් ඒ සඳහා ඉදිරි පියවර අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ප්‍රකාරව කල නොහැකිව පවතී. මේ තීරණය වෙනස් කිරීමට නව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර. එය අනුමත කරනු ලැබුවහොත් මෙම අත්තිකාරම් මුදල් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට හැකියාව ඇති අතර. එතෙක් කොම්පැනි සභාවෙන් ගත හැකි ක්‍රියා මාර්ගයක් ද නොමැත.

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පැනි සභාවේ සේවයේ නියුතු සේවකයින් වෙත නිවසක් තනා ගැනීම සඳහා ඉඩම් කොටසක් ලබාදීමේ වැඩ පිළිවෙල ආරම්භ වී ඇත්තේ 1982 වර්ෂයේ සිටය. එකී වැඩ පිළිවෙල යටතේ 1982 වර්ෂයේ සිට කොම්පැනි සභා සේවයේ යෙදී සිටින ලද නිලධාරීන් 351 දෙනෙකු හට දිස්ත්‍රික් කිහිපයක ක්ෂේත්‍රයේ නිදහස්ව පැවති ඉඩම් කොටස් ලබාදීම සිදු කර ඇත.

සේවකයින්ට ඉඩම් ලබාදීමේ වැඩ පිළිවෙලේ දෙවන අදියර ලෙස 2005 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පැනි සභාව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විෂය පථයට අයත්ව තිබූ අතර විෂය භාර අමාත්‍යතුමන් විසින් ශ්‍රීලංකා නිදහස් සේවක සංගමයේ ලිඛිත ඉල්ලීමට අනුමැතිය ලබා දී ඇත.

එකී අනුමැතිය පදනම් කොට කොම්පැනි 2005 වර්ෂයේ සිට අවස්ථා කීපයකදීම කරුණු සභාව වෙත ඉදිරිපත් කර ඉ.ප්‍ර. පනතේ 22(1) (ඇ) වගන්තිය ප්‍රකාරව සේවකයින්ට නිවාස අරමුණ මූලික කර ගනිමින් ඉඩම් කොටස් ලබාදීම සඳහා අනුමැතිය ලබාගෙන ඇති අතර එකී කොම්පැනි සභා පත්‍රිකා සහ තීරණ මීනැමු අවස්ථාවක විගණනය සඳහා යොමු කිරීමේ හැකියාව ඇති බවද සඳහන් කරමි.

තවද 2005 වර්ෂයේදී ඉ.ප්‍ර.කො. සභාවට අයත්ව තිබූ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සහිත සටහනේ මුල් පිටපත කොමිෂන් සභාව සතු කර ඇති බැවින් නැවත ගරු විෂය භාර අමාත්‍යතුමන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කිරීමක් සිදු නොවී ඇති බවද වැඩි දුරටත් සඳහන් කර සිටිමි.

(iv) අත්තිකාරම් ගෙවන ලෙසට ආයතන හෝ පුද්ගලයින් දැනුවත් කර ඒ අනුව කටයුතු කර ඇත. මෙහිදී එකවරම මුදල් ගෙවීමට හැකියාවක් නොතිබුණු ආයතන හෝ පුද්ගලයින් මුල් අත්තිකාරම ගෙවූ ආසන්න දිනක එකී හිඟ මුදල ගෙවා ඇති බවක් නිරීක්ෂණය වේ.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත

45 (i)(අ)(iii) වගන්ති — ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ එම වගන්තියේ දක්වා ඇත්තේ අග්‍රාමාත්‍යවරයා විමසා එක් සාමාජිකයෙකු පත් කල යුතුය යන්න හෝ අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් අයෙකු පත්කල යුතුය යන්නය. නමුත් දැනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කරමින් සාමාජිකයෙකු සහභාගී වේ.

(ආ) 1971 අංක 38 දරණ මුදල් පනත

11 වන වගන්තිය — ආයෝජන සම්බන්ධව ආයතනය මගින් ලබාගත් පොදු තීරණයක් මත කටයුතු කර ඇත.

(ඇ) 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත

මෙම පනත් දෙක සම්බන්ධයෙන් අප ආයතනය ලියාපදිංචි විය යුතු බවට දේශීය ආදායම් කොමසාරිස් වරයා විසින් අප වෙත දැනුම් දී ඇති බැවින් ඒ සඳහා 2015.06.11 දින පැවති කොමිෂන් සභාව ද දැනුවත් කර ජූනි මාසය තුළ ලියාපදිංචි වන බවට සටහන් කරමි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

II පරිච්ඡේදය 13.3 වගන්තිය- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ/මුදල් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පල කිරීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයන් ද පවත්වන ලදී.

ඉඩම ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව තුල පෙර ක්‍රියාත්මක වූ බඳවා ගැනීම් පරිපාටිය අදාල කර ගනිමින් 2007.03.16 සහ 2009.03.30 යන දිනයන්හිද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව තුල ක්‍රියාත්මක නව බඳවා ගැනීම් පරිපාටිය අනුව 2012.12.11, 2013.05.20, සහ 2013.12.02 යන දිනයන්හිද ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවා ඉදිරිපත් වූ අයදුම්පත්වලට අදාල අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණවලට ද භාජනය කරන ලදී.

එහෙත් ඉදිරිපත් වූ අයදුම්කරුවන් බඳවා ගැනීම් පරිපාටියේ ඇතුලත් සුදුසුකම් වලින් යුක්ත නොවීමත්, ඉදිරිපත් වූ අයදුම්කරුවන් බඳවා ගැනීම් පරිපාටියේ ඇතුලත් වැටුප සම්බන්ධයෙන් එකඟ නොවීමත් යන හේතූන් මත අදාල තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට හැකියාවක් නොමැති විය.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ඉදිරියේදී පැවැත්වීමට නියමිත කොමිෂන් සභාවේ දී ද සාකච්ඡාවට ලක්කර සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කරනු ලබන බවට වාර්තා කරමි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) *මුදල් රෙගුලාසි 502 (2)* ඉඩම හැර අනෙකුත් ස්ථාවර වත්කම් සම්බන්ධව ලේඛණයක් මුදල් අංශයේ පවත්වා ගෙන යනු ලැබේ. එහි පිරිවැය, අත්පත් කර ගත් දිනය, වාර්ෂික ක්ෂය අනුපාතය සඳහන් කරමින් 2009 වසරේ සිට මෙම ලේඛණ යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යනු ලැබේ.



73

(ii) *මුදල් රෙගුලාසි 134 (3)*- අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් පසුගිය වකවානුවේ ඔබ වෙත යොමු නොකර ඇති අතර, මෙම වසරේ සිට සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකම පිටපතක් එවීම ආරම්භ කර ඇත.

(iii) *මුදල් රෙගුලාසි 371(2) (අ)*- අත්තිකාරම් ලබා ගත් පසු එය නියමිත පරිදි පියවා නොතිබෙන බව නිරීක්ෂණය වූයෙන් ඒ පිළිබඳ නිලධාරින් දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට අධ්‍යක්ෂ/මුදල් දැනුවත් කරන ලදී.

(iv) *මුදල් රෙගුලාසි 371(2) (ආ)*- උපලේඛණ අංක 02 ට අනුව අවස්ථා තුනකදී පමණක් සීමාව ඉක්මවා අත්තිකාරම් මුදල් ලබා ගෙන ඇති අවස්ථා දැක්විය හැක. එන්. මුරගේ මාණ්ඩලික සහකාර වරයෙකු වන අතර, ඔහු සැපයුම් නිලධාරියාද වේ. ඔහු අත්තිකාරම් සීමාව තුළ අත්තිකාරම් ලබාගෙන ඇත.

තඩු තීන්දු මගින් හදිසි නඩු කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම හදිසි ඔප්පු උත්සව රාජකාරි කටයුතු, දිස්ත්‍රික් කාර්යාලය විවෘත කිරීම සඳහා ආදී වශයෙන් හදිසි වියදම් පියවා ගැනීම සඳහා වූ මාගේ අනුමැතිය මත සීමාව ඉක්මවා අත්තිකාරම් ගෙවීමට සිදු වූ අවස්ථා ඇත. මෙම අත්තිකාරම් මුදල් හදිසි රාජකාරීමය තත්වය මත වෙන කලයුතු කිසිවක් නොමැති බැවින් ලබාදීමට සිදුවූ බව දන්වමි.

(v) *මුදල් රෙගුලාසි 371(4)* කලයුතු කාර්යයේ වැදගත්කම අනුව ඒ සඳහා යන වියදම් ඇස්තමේන්තුවක් මත අදාල අත්තිකාරම් මුදල් ලබා ගන්නා ලෙසට නිලධාරින් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසටත්, ඉදිරියේදී මෙම වැරදි අවම කර ගනිමින් ගිණුම් පවත්වා ගෙන යන ලෙසටත් අධ්‍යක්ෂ මුදල් වෙත උපදෙස් ලබාදෙන ලදී.

(vi) *මුදල් රෙගුලාසි 756* -2014 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ කටයුතු දැනට 90% ක් පමණ අවසන් කර ඇත. කාර්ය මණ්ඩලයේ ඌනතාවය හා ප්‍රවාහන පහසුකම් ප්‍රමාදය මත මෙය අතපසු වී ඇත. 2015 ජුනි 30 ට පෙර මෙය අවසන් කර අදාල ලිපි ගොනුව විගණන අංශය වෙත භාර දෙන බවට දන්වමි.

(ඒ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

---

(i) 4.2.6 වගන්තිය — වාර්ෂික කාර්ය සාධන වාර්තාව අදාල අමාත්‍යාංශ වෙත යොමු කර ඇති අතර. 2014 වසරේ සිට කාර්තුමය මූල්‍ය වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට යොමුකර ඇත. 2015 වසරේ ප්‍රථම කාර්තුමය වාර්තාව ද අප්‍රේල් 30 ට පෙර යොමුකර ඇත.

(ii) 6.5.1 වගන්තිය — 2014 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තා කෙටුම්පත 2015.03.02 දිනැති ආවරණ ලිපියෙන් අදාල ආයතනවලට යොමුකර ඇත.

3. මූල්‍ය සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵල

---

2014.12.31 දිනට ලැබිය යුතු ආදායම උපචිත නොවීම මෙම වෙනසට ප්‍රධාන හේතුවක් වී ඇත. එය සංශෝධනය කල පසු පසුගිය වසරට සාපේක්ෂව මිලියන 50 කට වඩා වැඩි ආදායමක් වාර්තා වේ. ඒ අනුව පිරිහීමක් නොව වර්ධනයක් බව සඳහන් කරමි.

**3.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(i) වෙළඳ හා අනෙකුත් ණය ගැතියන්ගේ අගය රුපියල් මිලියන2158 ක් වීම මත මෙම අනුපාතය වැඩි වී ඇත. ජංගම වත්කම් තුල නිරූපනය කරනු ලබන සියලුම වත්කම් ද්‍රවශීල වත්කම් වීමත් මෙයට හේතු වී ඇත.

(ii) අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් මස තුල මිල ගණන් කැඳවා තිබූ අතර. ඒ සඳහා අනුමැතිය ලබාගෙන ආයෝජනය කිරීමට ප්‍රමාද වීම මත මුදල් හා මුදල් සමග ඇති වටිනාකම පෙර වසරට සාපේක්‍ෂවව වැඩි වී ඇත. මෙම මුදල් 2015 ජනවාරි මස මුල් සතිය තුල ආයෝජනය කරන ලදී.

**3.3** ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මේ සම්බන්ධයෙන් ඔබ වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති අතර. එහි පිටපතක් නැවත ඉදිරිපත් කිරීමට දැනුම් දෙන ලදී

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) 2014 වර්ෂය සඳහා ඉඩම් විකිණීම හා බදු දීම සඳහා ඇස්තමේන්තුගත ආදායම රුපියල්. 144,194,520/- කි. මූල්‍ය ප්‍රකාශන අනුව සත්‍ය ආදායම රු. 175,194,301/- කි. මේ අනුව වෙනස 70% ක් නොව 21% කි. මෙම විචලනයේදී අවම වන ලෙස අයවැය ඇස්තමේන්තුව සකස් කරන ලෙස අධ්‍යක්‍ෂ/මුදල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ආ) අයවැය ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාව වන විට වන්දි ගෙවීම සම්බන්ධයෙන් උසාවියේ තැන්පත් කිරීමට අදාළ නියෝග පිළිබඳ අවසන් තීරණයන්ට එළඹී නොතිබූ බැවින් ඒ සඳහා ප්‍රතිපාදන නොකරන ලදී. එය මෙම වෙනසට හේතු වී ඇත. ඉදිරියේදී මෙම විචලනයන් අවම කර ගන්නා බව සඳහන් කරමි.

(ඇ) වර්ෂය ආරම්භයේදී ක්‍රියාකාර සැලැස්ම සඳහා ඇතුලත් කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් සාකච්ඡා කලද, පසුව ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීමත් ඒ ඒ අවස්ථාවට යෙදෙන වෙනත් හදිසි රාජකාරිවල නිරත වීමත් යන හේතූන් මත ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් කාර්යයන් ක්‍රියාත්මක කරලීම මගහැරී ඇති බවට නිරීක්ෂණය කරමි.

බොහෝ අවස්ථාවල දී ක්‍රියාකාරී සැලැස්ම අනුව යමින් යම් යම් කාර්යයන් ඉටුකරලීම ආරම්භ කලද, යෙදෙන වෙනත් හදිසි හා අත්‍යාවශ්‍ය වූ රාජකාරිවල නිරත වීම මත යම් යම් අතපසුවීම් මත ආරම්භ කල ක්‍රියාකාරී සැලැස්මේ රාජකාරී අවසන් කර ගැන්මට හැකියාව නොලැබී ඇති බව ද පෙන්වා දෙමි.

කෙසේ වෙතත් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇති අත්‍යවශ්‍ය රාජකාරී බොහෝමයක් මගහැරී ඇති බවද පිළිගන්නා අතර, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී.

(ඈ) ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම සකස් කරලීමේදී ඉලක්කයන් සම්බන්ධයෙන් නැවත සාකච්ඡා කරමින් අදහස් හා යෝජනා ලබා ගනිමින් නිශ්චිතව ඉටු කල හැකි වන පරිදි කාර්යයන් ඇතුලත් කිරීමට වග බලා ගන්නා ලසට නිලදාරීන් දැනුවත් කරන ලදී.

(ඉ) ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන පරිදි හැකිතාක් දුරට සැලකිලිමත් වන ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කරන ලද අතර, ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති සියලුම කාර්යයන් සඳහා ආදායම වියදම පැහැදිලිව සටහන් කරන ලෙසටත් උපදෙස් ලබා දෙන ලදී.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

(අ) (i) මෙම කොම්පැනි සභාව ආරම්භයේ සිට පවරා ගත් ඉඩම් වෙනුවෙන් දළ වශයෙන් ගණනය කරන ලද වන්දි හා වන්දි පොලී වලට අදාළ මුදලක් දැනට ගිණුම් වාර්තාවල වන්දි අවිනිශ්චිත ගිණුම I හා II වශයෙන් පෙන්නුම් කර ඇත. වන්දි හා වන්දි පොලී වශයෙන් නිශ්චිත මුදලක් අද දක්වා නිශ්චිතවම කිව නොහැකි බැවින් මෙම සම්බන්ධයෙන් ගිණුම්වලට ගැලපීම නොකරන ලදී.

(ii) අදියර I හා II යටතේ කාර්ය සාධන වාර්තාවේ වෙන් කරන ලද මුදල වන්දි මුදල් හා පොලී යන දෙකටම බැවින් එය නිවැරදි වේ.

(iii) හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 110 න් 106 තවදුරටත් වන්දි ගෙවීමට නොහැකිව පවතී. එයට හේතුව වන්නේ හිමිකම් තහවුරු කිරීම හා අවශ්‍ය ලේඛණ ලබා ගැනීමට නොහැකි වීමත්, උරුමකරුවන් මේ පිළිබඳ උනන්දු නොවීමත් ය.

මේ පිළිබඳව 2014 වර්ෂය තුළ දිස්ත්‍රික් කාර්යාල වෙතින් ද විමසා කටයුතු කර ඇතත්, ලේඛණ ලබා ගැනීමට නොහැකි වී ඇත. එසේ වී ඇත්තේ බොහෝ ප්‍රකාශකයින් මිය යාමත්, උරුමකරුවන් පිටරට පදිංචියට ගොස් ඇති නිසාත් ලබා ගත හැකි වන්දි මුදල සුළු නිසා ඒ පිළිබඳව කටයුතු කිරීම අත්හැර ඇති බවත් ය. තවද, මෙම ලිපිගොනු 106 පිළිබඳව ප්‍රකාශකයන් වෙත අවසන් නිවේදන යවා ඇති බැව් සඳහන් කරමි.

බුක්තිය භාර ගැනීමේ සහතික අඩුපාඩු ලිපිගොනු පිළිබඳවත් දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, බුක්තිය නොමැතිව වන්දි ගෙවීම් කටයුතු කළ නොහැකි නිසා එම ලිපිගොනුවල කටයුතු තාවකාලිකව නවතා ඇත.

(iv) තවදුරටත් ලිපිගොනු 575 කට ආසන්න ප්‍රමාණයක තොරතුරු ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර, ව්‍යවස්ථාපිත නිශ්චය ලබා නොදී ඇති ලිපිගොනු ප්‍රමාණය ද මෙතනට ඇතුළත් වේ. ව්‍යවස්ථාපිත නිශ්චය ලබාදීමට ඉඩම් නොමැතිකම, මැණුම් කටයුතු ප්‍රමාදවීම, ප්‍රකාශකයින්ගේ උනන්දුවක් නොමැතිකම මෙම කටයුතු කිරීමට ප්‍රමාද වී ඇත.

(v) අධිකරණයේ මුදල් තැන්පත් කිරීමට කටයුතු යොදමින් පවතී. එම ලිපිගොනු 60 පිළිබඳ ලැයිස්තුව මේ සමග ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කරමි.

(vi) කොමිපත් සභාව විසින් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කර ඇතත්, වන්දි ලබා ගැනීමට ප්‍රකාශකයින් ඉදිරිපත් නොවීමත්, ඒ සඳහා විකල්ප ඉඩම් ලබා දෙන ලෙසට ඉල්ලුම් කිරීමත්, ප්‍රකාශකයින්ගේ අයිතිය (හිමිකම) තහවුරු කිරීමේ නීතිමය ලියකියවිලි ආදිය පිළිබඳ පැන නැගී ඇති ගැටළුකාරී තත්වයන් හේතුවෙන් වන්දි ගෙවීම ප්‍රමාද වී ඇත. දැනට මෙසේ හෝ සුළු ප්‍රමාණයක් හෝ ගෙවීම කරන්නේ ප්‍රකාශක හිමිකම තහවුරු වන ආකාරයට අධිකරණ නියෝගයන් මත උසාවියේ තැන්පත් කිරීම සඳහා ය

(vii) 2014 වර්ෂය අවසානයේදී ද චන්දි මුදල් හිමිකම සම්බන්ධව කොමිෂන් සභාවට එරෙහිව අධිකරණයේ පවතින නඩු 14 සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ විභාග වෙමින් පවතින අභියාචනා 07 ක් ද තවමත් විභාග වෙමින් පවතී. එම නඩු විභාග මෙතෙ ක් අවසන්ව නොමැත.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------

(අ) මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ලද පොදු තීරණයක් මත කටයුතු කර ඇත. මෙහි තීරණයේ පිටපතක් සොයා ගත නොහැකි බැවින් නැවත තීරණය අළුත් කිරිම සඳහා විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. එහිදී තීරණය වූයේ නැවත මහා භාණ්ඩාගාරය වෙත ලිඛිතව ඉල්ලීමක් කර එම තීරණය ලබා ගන්නා ලෙසයි. ඒ අනුව කටයුතු කරන බව දන්වමි.

(ආ) පොල් වගාව සම්බන්ධ ගම්පහ හා පුත්තලම දිස්ත්‍රික්කවල අප වෙත පැවරුණු අක්කර 60 - 80 ක පමණ ඉඩම් ප්‍රමාණයක් ඇත. මෙම ඉඩම් පැවරෙන අවස්ථාවේ ඉතාමත් නොදියුණු තත්වයක පැවති බැවින් එහි පොල් ආදායම ඉතාමත් අඩු තත්වයක පවතී. මෙම ඉඩම සංවර්ධනය කිරිම සඳහා විශාල මුදලක් වැය වන බැවින් එය පියවරෙන් පියවර වැඩිදියුණු කිරිමට බලාපොරොත්තු වෙමි. තවද, මෙය අපගේ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යන්නේ ද නැතහොත් බදු පදනම මත ලබාදීම වාසිදායකද යන්නත් සලකා බලා ඉදිරියේදී තීරණයක් ගන්නා බවද දන්වමි.

(ඇ) 2002 - 2004 කාලයට අදාළව ලබා ගන්නා ලද ඉඩම් විකුණුම් හා බදු අත්තිකාරම් සඳහා ලබා ගන්නා ලද තක්සේරු අත්තිකාරම ඇතුළුව 2014.12.31 දක්වා ලැබුණු අත්තිකාරම මෙහි ඇතුලත්ව ඇත. මෙය අවුරුදු 14 ක පමණ මුදල් පොත් හා රිසිට්පත් පරීක්ෂා කර බලා සකස් කර ගත යුතු ලේඛණයක් බැවින් දිගු කාලයක් තුල අධ්‍යයනය කර ගිණුම් වාර්තාවලට ලේඛණයක් ලබාදීමට බලාපොරොත්තු වෙමි.

(ඇ) අනුරාධපුර, අම්පාර හා යාපනය යන දිස්ත්‍රික් කාර්යාල තුනේ ආදායම මෙම සීමාව නොඉක්මවන අතර, අනෙකුත් දිස්ත්‍රික් කර්යාල 17 ඉහළ ආදායමක් 2014 වර්ෂය සඳහා වාර්තා වී ඇත.

මෙම දිස්ත්‍රික් කාර්යාල සතුව විශාල ඉඩම් ප්‍රමාණයක් නොමැති වීමත්, තිබෙන ඉඩම්වලද කටයුතු අවසන් වෙමින් පවතින බැවිනුත් මෙම කාර්යාලවල ආදායම් අඩු මට්ටමක පවතී.

ඉදිරියේදී රියදුරු තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමක් සිදු නොවන අතර, තාවකාලිකව සේවයේ යොදවා සිටින රියදුරු මහතාගේ සේවා කාලය නුදුරේම අවසන් වීමට නියමිත බව ද සඳහන් කරමි.

තවද, අනුමත සේවක සංඛ්‍යාව තුල පුරප්පාඩුව පවතින සියලුම තනතුරු සඳහා අදියර කීපයක් යටතේ හෝ නියමිත ක්‍රමවේදය යටතේ සුදුස්සන් බඳවා ගැනීමටත්, කටයුතු කිරීමට අපේක්ෂා කරනු ලබන බවද සඳහන් කර සිටිමි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා වූ සකස් කරනු ලබන ක්‍රියාත්මක සැලැස්මේ ඇතැම් කාර්යයන් ඉටු කරලීමේදී කොමිෂන් සභාව විසින් ඒ සඳහා වියදම් දැරීමක් සිදු නොවන අවස්ථාවන් ද ඇත.

එබැවින් මින් ඉදිරියට ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලබන අවස්ථාවේදීම එම වියදම් නොදරන කාර්යයන් ඉදිරියේ යම් කෙටි සටහනක් යෙදීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී.

(ආ) විගණනයෙන් පෙන්වා දී තිබූ අඩුපාඩු සම්බන්ධයෙන් අවධානය යොමුකර ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පෙරට වඩා සැලකිලිමත් වන ලෙසට අදාල අංශය හා නිලධාරීන් දැනුවත් කරන ලදී.

(ඇ) ප්‍රගතිය දැක්වෙන වාර්තාවේ ක්‍රියාකාරකම් සඳහා වන ආදායම ආසන්න වශයෙන් වන සේ ඇතුලත් කිරීම සිදුකර ඇති බැවින් යම් වෙනසකට ලක්ව ඇති බව නිරීක්ෂණය කරමි.

සෙසේ පෙනත් විශේෂයෙන් පෙන්වා ඇති සියලු කරුණු අවධානයට ලක්කර අදාල කාර්යයන් ඉටු කරනු ලබන අංශයන් අතර සාකච්ජා කර නිවැරදිව තොරතුරු ඇතුලත් කරලීමට පියවර ගන්නා ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී.

(ඇ) 2014 වර්ෂය සඳහා කල්බදු ක්‍රමයට වාහන 03 ක් මිළ දී ගැනීමට යෝජනා වී තිබුණද, වර්ෂ අවසානයේදී එය ක්‍රියාවට නැංවීමට යොදාගෙන තිබූ බැවින් එහි අවසන් ප්‍රතිඵලය ලබා ගැනීමට හැකි වී නොමැත.

පැවැති දේශපාලන රටාව ද මෙයට හේතුවක් වූ බව ද සැලකිය හැකි අතර, 2014 වර්ෂය සඳහා කොමිෂන් සභාව වෙත නව වාහන මිළ දී ගැනීමක් සිදු නොවූ බැවින් ඒ සඳහා වියදම් දැරීමක් සිදු නොවූ බැවින් ප්‍රගතිය දැක්වෙන වාර්තාවේ මේ සඳහා වියදම ඇතුලත් වීම මුද්‍රණ දෝෂයක් බව නිරීක්ෂණය කරමි.

## 5.2 අභ්‍යන්තර විගණනය

2014 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව මුදල් අංශයේ මුදල් ලැබීම් හා ගෙවීම් පරීක්ෂාවන් බොහෝ දුරට සිදුකර ඇත. තවද, පැවරීම් අංශයේ ලිපිගොනු පරීක්ෂාවන් ඔප්පු බෙදාදීමේ ක්‍රියාවලිය යටතේ සිදුකර ඇත.

දිස්ත්‍රික් කාර්යාල විගණනයේදී එම කාර්යාලවලට ලැබී ඇති ආදායම් වියදම් වාර්තා පරීක්ෂා කර ආදායම් අඩු දිස්ත්‍රික් කාර්යාල සඳහා ආදායම අඩු වීමට හේතු සොයා ඒ පිළිබඳ නිලධාරින් සමග සාකච්ඡා කර ඉලක්කගත ආදායම සොයා ගැනීමට උපදෙස් දෙන ලදී.

ආදායම් අංශය හා මුදල් අංශය එකතුව මාසික ගිණුම් වාර්තා සකස් කොට එහි ඇති ප්‍රවනතාවය මා හට දන්වන ලෙස උපදෙස් දෙන ලදී.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

2014 වසරේ සැප්තැම්බර් මස අයවැය වාර්තාව සංශෝධනය කරන ලද අතර, එහි පිටපතක් විගණන අංශය වෙත ලබා දීමට නොහැකි විය. ඒ අනුව මෙම විචලනයන් අවම කරගෙන ඇති අතර, ඉදිරියේදීද විචලනයන් අවම කර ගනිමින් යහපත් අයවැය පාලනයක් ඇති කර ගන්නා බව සඳහන් කරමි.

6. පද්ධති හා පාලනයන්

-----------------

(අ) තඩු ලේඛණය - 2014.12.31 දින වන විට තඩු ලේඛණය සකස් කර ඇත.

(ආ) ශේෂ සනාථ ලිපි ලබාගැනිම- විගණකාධිපති වෙත සෘජුවම පිළිතුරු ලැබෙන ලෙස ශේෂ සනාථ ලිපි යවා ඇත.

(ඇ) ඉඩම ලේඛණය - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරුණු නිශ්චිත ඉඩම් ප්‍රමාණය. එයින් බැහැර කිරීම් සහ මේ වන විට ක්ෂේත්‍රයේ නිදහස්ව පවතින ඉඩම්- තොරතුරු ඇතුලත් කර දිස්ත්‍රික්ක වශයෙන් වෙන් වෙන්ව තොරතුරු ඇතුලත් කර ඉඩම් ලේඛණයේ කටයුතු ආරම්භ කර ඇති අතර. දිස්ත්‍රික් කාර්යාලවලින් ගන්නා තොරතුරු පදනම් කොට ගෙන ක්‍රියාත්මක වීම මත ලබා දෙන්නාවූ යම් යම් තොරතුරුවල සත්‍යතාවය තිරාකරණය කර ගැනීමේදී යම් ප්‍රමාදයක් සිදුවන බැවින් ඉඩම් ලේඛණයේ රාජකාරි අවසන් කර ගැනිමට නොහැකි වී ඇත.

(ඈ) බඩු ලේඛණය- බඩු ලේඛණය සකස් කර එහි පසු විපරම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(ඉ) ඉදිරි වැඩ සටහන් - දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරින්ගේ ඉදිරි වැඩ සටහන් පූර්ව මාසයේ 25 වන දිනට පෙර ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු බවට හා ඉදිරිපත් කරනු ලබන මාසික ඉදිරි වැඩ සටහන් . සංශෝධිත වැඩ සටහන්. කළ වැඩ සටහන් විස්තරයන් විධිමත් හා ක්‍රමවත් පරිදි කිරීමට අවශ්‍ය දැනුවත් කිරීම කටයුතු සිදු කරන අකාරය පිළිබඳව පසු විපරම් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය වෙත දැනුවත් කරන ලදී.

(ඡ) දෛනික ධාවන සටහන්පත් - දෛනික ධාවන සටහන් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට . රියදුරු සහ ධාවන සටහන් පරීක්ෂා කරනු ලබන නිලධාරීන්ට එය නිවැරදිව පවත්වා ගෙන යන්නේදැයි සොයා බලන ලෙස උපදෙස් දෙන ලදී.

(ට) වාහන උපයෝජනය- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාහන සංචිතයේ පවතින වාහන සම්බන්ධයෙන් සියලු රාජකාරි කටයුතු අභ්‍යන්තර විගණන අංශය හා සම්බන්ධ වෙමින් මතුවන ගැටළු අවම කර ගැනීමට ඉදිරි කටයුතු සිදු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.

(ඨ) මුදල් ලැබීම පිළිබඳ අභ්‍යන්තර පාලනයන් - දිස්ත්‍රික් කාර්යාල 18 කට අදාළ ආදායම රැස්කිරීමේ ගිණුම විවෘත කර එම මසට අදාළ ආදායම එම ගිණුමේ බැර කරන ලෙසත්. මාසය අවසන ඊලග මස 10 වෙනිදා එම මුදල ප්‍රධාන කාර්යාලයට මාරු කරගනු ලැබේ. ගිණුම් තැබීමේදී එම ආදායම් මුදල් නිවැරදිව ගිණුම්වලට මාරු වී ඇද්ද යන්න සලකා බලන අතර. ප්‍රධාන කාර්යාලයට මුදල් ලැබීම PIV හරහා දෛනිකව මුදල් පොතට ඇතුලත් කරනු ලැබේ. ඒ අනුව මුදල් ලැබීම් පිළිබඳ අභ්‍යන්තර පාලනය වෙනදාට වඩා සතුටුදායක බව සඳහන් කරමි.

පී.ඒ.සුමනතිස්ස තාඹුගල
සභාපති.
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

# විගණන හා කළමනාකරණ කමිටු

# රැස්වීම් වාර්තාව - 2014

**2014.06.02 වැනිදින ප.ව.2.30 ට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවති 2014 වර්ෂයට අදාල 01 වැනි විගණන කමිටු රැස්වීම වාර්තාව**

පැමිණීම :

01. පී.සී.සේනාරත්න මහතා - සභාපති

02. එච්.ඒ.එස්.වීරසිංහ මහතා - සාමාජික

03. එම්.අනෝමා නන්දනී මිය - සාමාජික

04. එම්.ආර්.ආර්.මල්ලව මිය - නිරීක්ෂක

05. පී.නරේන්ද්‍රනාදන් මයා -

06. සෙනරත් වනිගතුංග මයා -

07. ශ්‍යාමලී රත්නායක මිය

08. ජේ.ඩබ්.හපුආරච්චි මයා

09.

ප්‍රථමයෙන්ම පසුගිය කළමණාකරන කමිටුවේදී සාකච්ඡාවට බඳුන් වූ කරුණු පිළිබඳ ප්‍රගතිය කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**2013.06.11 දින පැවති විගණන හා කළමණාකරන කමිටුවේ ප්‍රගතිය**

01.

i **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම් තහවුරුකර නොමැතිකම නිසා වන්දි ගෙවීමට නොහැකි විය.**

පළවෙනි නිර්දේශය ක්‍රියාත්මක කර ඇති අතර යහපත් ප්‍රතිඵල ලැබී නැත. ඒ අනුව නීති උපදේශකගේ තීරණය ක්‍රියා කිරීමට තීරණය කර ඇත.

ii **වන්දි වෙනුවට හුවමාරු ඉඩම් ඉල්ලා සිටීම.**

මෙම කරුණට අදාලව කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කළ හැකි බව අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි ප්‍රකාශ කරන ලදී.

iii [illegible] නොමැති වීම.

[illegible] ලබාගෙන ඇත් අතර අංක 8773 [illegible] [illegible] ලෙස අධ්‍යක්ෂ /තක්සේරු හා [illegible] කිරීමටත් මෙම කරුණ සභාපතිතුමා [illegible] [illegible] තීරණයක් ගැනීමට නියමිතය.

iv

v [illegible] **ලිපිගොනු සංඛ්‍යාව 26 යි.**

[illegible] හේතු යටතේ දක්වා ඇති ගොනු 26 ට අදාළව නිශ්චිත හේතුව අධ්‍යනය [illegible] අනුව දැනටමත් වර්ගීකරණය කර ඇති 1- 7 දක්වා ගොනුවලට ඇතුලත් කරන ලෙස අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි වෙත දැණුම් දෙන ලදී.

vi -

vii **වන්දි ගෙවීමට අදාලව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පල කිරීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව - 670**

අවම වශයෙන් ගොනු 20 ක ප්‍රගතිය වාර්තා කිරීමට ලේකම්තුමා එකග විය.

02. -

03. **දිස්ත්‍රික් කාර්යාල මගින් ලැබෙන විවිධ ආදායම් වැඩිදියුණු කිරීම පිලිබඳ සාකච්ජා කිරීම**

මේ පිලිබඳ අධ්‍යක්ෂ/මුදල් විසින් අභ්‍යන්තර චක්‍ර ලේඛනයක් මගින් හා අභ්‍යන්තර විගණක විසින් බදු ලේඛනයේ වර්තමාන තත්වය පිලිබඳ ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීමට එකග විය.

04. **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා මසකට රු.33000/- ක ගෙවල් කුලී ගෙවීමට සිදුවී ඇති අතර. අළුත් ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ සාකච්ජා කිරීම.**

දැනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් සොයා ගෙන ඇති අතර ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්තුමාගේ එකගතාවය ලැබී අත. නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු අනෙකුත් ආයතනයන්ගෙන් සැලසුම් අනුමැතිය ලැබීමට ක්‍රියා කරමින් සිටී.

05. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු 307 ක ප්‍රමාණයක් අනුමත කර එවා ඇති අතර. ඉතිරි පිරිස අනුමත කර ගැනීමට සාකච්ඡා කළ යුතු බව තීරණය විය. කළමනාකරන සේවා අංක 30 අනුව සේවකයින් සියළු දෙනා අන්තර්ග්‍රහන ක්‍රියාවලිය සිදුකර වැටුප් සකස් කිරීමට කටයුතු කර ඇත.

දැනට මේ පිළිබඳ කටයුතු කරගෙන යනු ලැබේ.

06 ඉඩම ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංචිතයේ ඇති වාහන හා දිස්ත්‍රික් කාර්යාල වලට ආදායම් වැඩිකර ගැනීම සඳහා පොද්ගලික වාහන වෙනුවෙන් අධික මුදලක් වැය වන බව පසුගිය වකවානුවේ සිදු වූ වාහන අනතුරු පිළිබඳවත් වාහන ගාල් කිරීම , වාහන පුද්ගලික පාවිච්චිය සම්බන්ධව සාකච්ඡා කිරීම

මීට අදාළ කොමිෂන් පත්‍රිකාවට අනුමැතිය ලැබී ඇත.

07. **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ණයගැතියන් පිළිබඳ රජයේ ආයතන හා පුද්ගලික ආයතන සම්බන්ධයෙන් ගතයුතු නීතිමය පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.**

අධ්‍යක්ෂ/මුදල් විසින් අදාළ ලේඛන ඉදිරිපත් කරන ලදී. එය සාමාජිකයින් අතර බෙදා හැරීමෙන් පසුව මේ පිළිබඳ ඊළඟ සාකච්ඡාවේදී සාකච්ඡා කිරීමට නියමිතය. මීට අදාළ අධ්‍යක්ෂ/මුදල් විසින් ඉදිරිපත් කරන ලද ලේඛනය නිර්ක්ෂණය කරන ලදී. එම ලේඛනයට අදාළ මුදල් හිඟ වීමට හෝ ලැබීමට ඇත්තේ කුමන වර්ෂයක පටන් ද යන්නත් අදාළ කාරණය හා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් සකස් කර මීළග විගණන රැස්වීමේදී ඉදිරිපත් කරන ලෙසත් අධ්‍යක්ෂ/මුදල් වෙත උපදෙස් දෙන ලදී.

## 2013.09.17 දින පැවති විගණන හා කළමණාකරන කමිටුවේ ප්‍රගතිය

01. i කොමිෂන් සභා නිලධාරින්ගේ පාරිතෝෂිත මුදල් ගණනය කිරීම.

මේ පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ඉල්ලා ලිපි යවා ඇත.

## 2013.11.06 දින පැවති විගණන හා කළමණාකරන කමිටුවේ ප්‍රගතිය

01. **දිස්ත්‍රික් කාර්යාල විගණනය කිරීම**

දැනට විගණනය නිම කර ඇති විගණන වාර්තා විගණකාධිපති වෙත යැවීමට අභ්‍යන්තර විගණක වෙත උපදෙස් දෙන ලදී.

02. -

[illegible]

[illegible] ලේඛණගත වෙත උපදෙස් දෙන ලදී

01 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්ම 2015 - 2016 - 2017 යන වර්ෂ 03 සඳහා සකස් කිරීමට උපදෙස් දෙන ලදී. ඒ අනුගෙය 2015 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්ම අවම වශයෙන් නොවැම්බර් 30 දිනට පෙර සකස් කරන ලෙස අධ්‍යක්ෂ/කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන වෙත උපදෙස් දෙන ලදී.

## 2014.06.02 දින පැවති විගණන හා කළමණාකරන කමිටුවේ ප්‍රගතිය

01. **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව ඇති වටිනා ගස් සංගණනය කර නොමැති හෙයින් විධිමත් ක්‍රමයකින් තොරව ගස් කපා ඉවත් කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම**

මෙම කාරණය උද්ගත වන්නේ කොමිෂන් සභාව විසින් ලබාදෙන ඉඩම් වල ගස් කැපීමට අවසර දෙන හෙයිනි. එසේ අවසර දෙන විට මුළු ඉඩමට අදාළ සම්පූර්ණ ගස් ප්‍රමාණය ගණනය කර කපා ඉවත් කිරීමට අනුමැතිය දෙන ලෙස අධ්‍යක්ෂ/ඉඩම් පැවරීම් වෙත උපදෙස් දෙන ලදී. මෙයින් ලැබෙන ආදායම වර්ෂයේ ආදායම් ගිණුමට ඇතුළත් විය යුතු බව සඳහන් කරන ලදී.

.............................................. ..............................................

සභාපති ලේකම්

විගණන හා කළමණාකරණ කමිටුව විගණන හා කළමණාකරණ කමිටුව

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| එම්.ජ්.එස්.වීරසිංහ මහතා | - සාමාජික | .............................. |
| එම්.ආර්.ආර්. මල්ලව මිය | - නිරීක්ෂක | .............................. |
| එච් (අනෝමා) නන්දනී මිය | - සාමාජික | .............................. |
| ආචාර්ය එච්.එම්.එස්.ජයතුංග | | .............................. |
| පී.නගේන්ද්‍රනාදන් මයා | | .............................. |
| කුසුම පෙරේරා මිය | | .............................. |
| ශෂිකලා [illegible] මිය | | |

7

2014.08.25 වැනි දින ප.ව.12.30 ට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවති 2014 වර්ෂයට අදාල 02 වැනි විගණන කමිටු රැස්වීම වාර්තාව

පැමිණීම :

| | | | |
|---|---|---|---|
| 01. | ජී. [illegible] රත්න මහතා | - | සභාපති |
| 02. | [illegible] එස්.වීරසිංහ මහතා | - | සාමාජික |
| 03 | එම්.අනෝමා නන්දනී මිය | - | සාමාජික |
| 04 | එම්.ආර්.ආර්.මල්ලව මිය | - | නිරීක්ෂක |
| 05 | සෙනරත් වනිගතුංග මයා | - | ලේකම් /අධ්‍යක්ෂ පාලන |
| 06 | එච්.එම්.එස්.ජයතුංග මිය | - | අධ්‍යක්ෂ ජනරාල් - නිරීක්ෂක |
| 06. | පී.නරේන්ද්‍රනාදන් මයා | - | අභ්‍යන්තර විගණක |
| 07. | ශ්‍යාමලී රත්නායක මිය | - | අධ්‍යක්ෂ/මුදල් (රා.ආ.) නිරීක්ෂක |
| 08. | ජේ.ඩබ්.හපුආරච්චි මයා | - | අධ්‍යක්ෂ/ඉඩම් (රා.ආ.) නිරීක්ෂක |
| 09. | පුෂ්පා කරුණාරත්න මිය | - | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති) නිරීක්ෂක |

ප්‍රථමයෙන්ම පසුගිය කළමණාකරන කමිටුවේදී සාකච්ජාවට බඳුන් වූ කරුණු පිළිබඳ ප්‍රගතිය කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

2014.06.02 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ ප්‍රගතිය.

(01) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වත්කම් ලේඛනය මූ.රෙ. 128 (1) (ඉ) අනුව සකස් කිරීම, ඉඩම් පවරා ගැනීමේ ලේඛනය හා බැහැර කිරීමේ ලේඛනයේ විධිමත් ලෙස ඉඩම් තක්සේරු කර පවත්වා ගැනීමට සම්බන්ධව සාකච්ජා කිරීම මීට පෙර මිලියන 17 ක් වියදම් කර මෘදුකාංග හඳුනා දී ඇතත් අද වන තුරු නිමා වී නොමැත. මෙම මුදල් අත්තිකාරම් ලෙස ලේඛන ගත කර ඇත. මේ සම්බන්ධව ගත යුතු ක්‍රියා මාර්ගය සාකච්ජා කිරීම.

පරිගණක මෘදුකාංගය සකස් කිරීම යන කරුණු අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ විභාග වෙමින් පවතින බැවින් ඒ පිළිබඳව තීරණයක් ගත නොහැක. කෙසේ නමුත් 2014-06-02 දින සිට තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු කොමිෂන් සභාවට ස්ථිරව පත් කර ඇති හෙයින් ඔහු විසින් සියලුම දිස්ත්‍රික්කයන්ට අදාල තොරතුරු ඇතුලත් කෙරෙමින් පවතින අතර දැනට පැවරුණු ලැබූ රන්පඩුම් වතු වලට අදාළ ලේඛනය සකස් කරමින් අවසාන අදියරේ පවතී. සම්පූර්ණ ප්‍රගතිය මීලග රැස්වීමට වාර්තා කිරීමට ලේකම්තුමා විසින් එකග වේ. දැනට මෙම

ලේඛනයට කොමිෂන් සභාවට පැවරුණු ඉඩම් හා බැහැර කරන ලද ඉඩම්ද ඇතුලත් වේ. ඊට අමතරව ප්‍රථමයෙන් බැහැර කරන ලදුව පසුව ප්‍රත්‍යාධිෂ්ඨ කරනු ලබන ඉඩම් ද මෙම ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත.

පරිගණක මෘදුකාංගයට අදාල මිලියන 17 ක මුදල සෑම වර්ෂයකම විගණකාධිපති වාර්තාවේ ඇතුලත් වන හෙයින් එම මුදල ගිණුම් වලින් කපා හැරීමේ හැකියාව පිළිබඳ සලකා බැලීම සඳහා වර්තමාන තත්වය පිළිබඳ වාර්තාවක් අල්ලස් හා දූෂණ සභාවෙන් ලබා ගන්නා ලෙසට අධ්‍යක්ෂ ජනරාල්තුමියට උපදෙස් ලබා දෙන ලදී.

02. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව ඇති වටිනා ගස් සංගණනය කර නොමැති හෙයින් විධිමත් ක්‍රමයකින් තොරව ගස් කපා ඉවත් කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම.

ගස් කපා ඉවත් කර ගැනීම සඳහා අවසර ලබා දෙන අවස්ථාවේදී ප්‍රධාන කාර්යාලයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් කිරීම සඳහා අධ්‍යක්ෂ තක්සේරු හා වත්දි හා අභ්‍යන්තර විගණක විසින් සහභාගි වී ඒ පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතු බව තීරණය විය.

2014.<u>08.25 දින පැවැති විගණන කමිටුවේ තීරණ</u>

01. නීති වියදම් අවම කිරීම

ඉඩම්ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නීති අංශයේ දැනට පැවැත්වෙන නඩු සංඛ්‍යාව 438 ක් බව විගණනයෙන් තහවුරු විය. මේ අතුරින් වැඩි නඩු ප්‍රමාණයක් වන්නේ දිස්ත්‍රික් උසාවියේ පවතින නඩුය. මසකට වැය වන නීති වියදම් දළ වශයෙන් රු. 300000.00 කි. නීති අංශයෙන් කියා සිටින්නේ අධ්‍යක්ෂවරුන් නඩු අවසන් කිරීම පිළිබඳ නිර්දේශ ලබා දෙන්නේ නම් එය අවසන් කිරීමට හැකි බවය. මේ සම්බන්ධව සුදුසු නිලධාරියෙක් පත් කිරීම , නඩු සමථයකට පත් කිරීමට අවස්ථාව තිබේ ද යන්න සාකච්ඡා කිරීම.

අලුතින් නඩු කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කර ඇති අවස්ථාවකදී සිතාසිය ලැබීමෙන් අනතුරුව අදාල පෙත්සම පිළිබඳ අධ්‍යයනය කර අවශ්‍ය උපදෙස් නඩුව සඳහා පෙනී සිටින අයට නීති අංශයෙන් ලබා දිය යුතු යැයි විගණන හා කළමනාකරණ කමිටුව නිරීක්ෂණය කරයි. දැනට පවත්නා නඩු සම්බන්ධයෙන් සම්පූර්ණ අධ්‍යයනයක් කර එම නඩු තවදුරටත් පවත්වාගෙන යා යුතුද නැතහොත් අවසන් කළ යුතුද යන්න පිළිබඳව විස්තරාත්මකව ලේඛනයක් ලබා 03.
ගැනීමට නීති උපදේශක වෙත යොමු කිරීමට සුදුසු යැයි තීරණය කරයි. මේ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ අධීක්ෂණය යටතේ ලේකම්තුමා විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ.

02 කොම්පන් සභාව වෙත ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

කොම්ෂන් සභාව වෙත වසර ගණනාවක් තිස්සේ ලැබිය යුතු මුදල් ලෙස 2013.12.31 දිනට රුපියල් මිලියන 2.218 ක් පෙන්නුම් කරනු ලැබේ. මෙම මුදල් අයකර ගැනීම සඳහා අවස්ථා ගණනාවකදී උත්සාහයන් දරුවද , එය අයකර ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව මෙම මුදල් ගිණුම් වලින් ලියා හැරීමට හෝ අවශ්‍ය වෙනත් ක්‍රියා මාර්ගයන් තිබේ නම් . ඒ පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

(i) *කොම්පන් සභාවේ සරප් නිලධාරිණිය භාරයේ තිබී අස්ථානගතවී ඇති රු.111,538.90 ක මුදල*

මෙම කරුණ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී උපදෙස් ලබාගෙන ඇත්තේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගිනි. එහෙත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පන් සභාව විසින් උපදෙස් ලබා ගත යුත්තේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් වේ. ඒ අනුව නැවතත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් ලියා උපදෙස් ලබා ගැනීමට තීරණය කරන ලදී.

(ii) *ටී.ඒ.එම්.ප්‍රසන්න මහතා - රු. 9900.00*

අදාල අයට ලියාපදිංචි ලිපියක් මගින් මුදල් ගෙවන ලෙස දැනුම් දීමට තීරණය විය.

(iii) *එම්.එල්.එම්.සාරිෆ් මහතාගෙන් අය විය යුතු මුදල රු.1000/-*

වැඩිපුර ගෙවා ඇති නිලධාරියා සම්බන්ධයෙන් සොයාබලා වාර්තා කිරීමට. ලේකම් වෙත දන්වන ලදී. ඒ සමගම මුදල් ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගැනීමට තීරණය විය.

(v) විස්තරාත්මක ලැයිස්තුවක් සකස් කරන්න.

(අධ්‍යක්ෂ/මුදල්) විස්තරාත්මක ලැයිස්තුවක් සකස් කිරීමට අධ්‍යක්ෂ මුදල් වෙත උපදෙස් දෙන ලදී.

03. කොම්ෂන් පත්‍රිකා සැකසීම. ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්ෂන් සභාවට ඉදිරිපත් කරන කොම්ෂන් පත්‍රිකා තුල අඩුපාඩු තිබෙන බවට වාර්තා විය. එය නිවැරදි ක්‍රමවේදයකට සකස් කිරීම සම්බන්ධව පුළුල් ලෙස සාකච්ඡා කිරීම.

මෙම කරුණු පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර ඉදිරියේදී කොම්ෂන් පත්‍රිකා ඉදිරිපත් කරන විට අදාල අංශය නම් කිරීමේදී දැනට නව ආයතන ව්‍යුහය තුල සඳහන් අංශ පමණක් අදාල අංශ ලෙස සඳහන් විය යුතු බවටද .

[illegible] පත්‍රිකා ඉදිරිපත් කරන අයගේ තනතුරු නාම දැනට අන්තර්ග්‍රහනය කර ඇත [illegible] අදාල තනතුරු නාම විය යුතු බව ද ලේකම්තුමා විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.

මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ විගණන අධ්‍යක්ෂ මල්ලව මිය අවධාරණය කර සිටියේ කොම්පත් පත්‍රිකා වලදී පමණක් නොව අභ්‍යන්තර සියලු ලිපි ගනුදෙනු වලදී ද , මෙම කරුණ අනුගමනය කල යුතු බවයි. මෙම සියලු කරුණු සලකා අභ්‍යන්තර චක්‍රලේඛනයක් නිකුත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල් තුමියට දන්වා සිටින ලදී.

**වෙනත් කරුණු :-**

අධ්‍යක්ෂ මුදල් තනතුර දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පවතින අතර දැනට එම තනතුරේ රාජකාරි කටයුතු කරනුයේ වැඩ බලන නිලධාරිනියක් විසින්ය. මෙම තත්වය දීර්ඝ කාලයක් තුළ පැවතීම අසතුටුදායක වන අතර, ඉල්ලුම්පත් කැඳවීමෙන් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවන්නේ නම් තනතුරට අදාලව සුදුසුකම් නැවත සලකා බැලීමට ඉල්ලීම ඉදිරිපත් කිරීම යෝග්‍ය බව සාකච්ජා විය. ඒ අනුව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් ගෙන් විමසා මේ පිළිබඳව සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට තීරණය විය.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ බදු ලේඛනය පිළිබඳව අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කළ වාර්තාව පරීක්ෂා කළ අතර, සවිස්තරාත්මක වාර්තාවක් මීළග කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුනි.

මීළග කළමනාකරණ කමිටු රැස්වීම 2014.10.07 දින ප.ව. 2.30 ට පැවැත්වීමට තීරණය විය.

| | |
|---|---|
| ........................................ | ........................................ |
| සභාපති | ලේකම් |
| විගණන හා කළමණාකරණ කමිටුව | විගණන හා කළමණාකරණ කමිටුව |

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| එම්.ජ්.එස්.වීරසිංහ මහතා | සාමාජික | ........................ |
| එම්.ආර්.ආර්. මල්ලව මිය | නිරීක්ෂක | ........................ |
| එම් [illegible] නන්දනී මිය | සාමාජික | ........................ |
| [illegible] එම් එස්.ජයතුංග මිය | | ........................ |
| [illegible] | | ........................ |
| [illegible] | | ........................ |

# 2014 වසරේ 03 වැනි විගණන හා කළමනාකරණ රැස්වීම

ස්ථානය :- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

දිනය :- 2014. 10. 10 වන දින.

වේලාව :- පෙ. ව. 9. 30 - ප. ව. 1. 00

**කමිටු නිලධාරීන්ගේ සහභාගීත්වය :-**

01. ජී. ඩබ්ලිව්. සේනාරත්න මහතා - සභාපති

02. එම්. ඒ. එස්. වීරසිංහ මහතා - සාමාජික

03. එම්. අනෝමා නන්දනී මිය - සාමාජික

04. එම්. ආර්. ආර්. මල්ලව මිය - නිරීක්ෂක

**ඉ. ප්‍ර. කො. සභාවේ නිලධාරීන්ගේ සහභාගීත්වය:-**

05. එච්. එම්. එස්. ජයතුංග මිය - අධ්‍යක්ෂ ජනරාල්

06 සෙනරත් වනිගතුංග මයා කමිටු ලේකම් (ලේකම්/අධ්‍යක්ෂ පාලන)

07. වී. නරේන්ද්‍රනාදන් මයා ප්‍රධාන අභ්‍යන්තර විගණක

08. ශ්‍යාමලී රත්නායක මිය - අධ්‍යක්ෂ/මුදල්

09. නන්දනී තිස්ස මිය - සහකාර අධ්‍යක්ෂ/මුදල්

10. ප්‍රදීප් කත්තංගර මයා - මාණ්ඩලික සහකාර (ආදායම්)

[illegible]යෙන් පසුගිය කලමණාකරණ කමිටුවේදී සාකච්ඡා [illegible]

පිළිබඳ ප්‍රගතිය කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

- කොම්පැනි සභාව විසින් බදු දී ඇති ඉඩම් ලේඛණය සකස් කර [illegible] නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අදාල ලේඛණ දිසත්‍රික් කාර්යාල වෙත 2014-07-30 වන දින යවා ඇති බවත්, ඒ සඳහා පිළිතුරු ලද පසු බදු ලේඛණය යාවත්කාලීන කළ හැකි බවත්, ආදායම් අංශයේ මාණ්ඩලික සහකාර විසින් සඳහන් කරමින් මීළග රැස්වීම් වාරයේදී එහි තත්වය වාර්තා කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

- ඉඩම් පිළිබඳ ලේඛණය සකස් කර අවසන් කර ඇත.

- දැනට වාර්ෂික ගිණුම්වල ණය ගැතියෝ රු: මි: 2154 ක් සෑම වර්ෂයකම හිග මුදල් ලෙස ඉදිරියට පැමිණේ. මෙම හිග මුදල්වල ආයතන වන්නේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව, පශු සම්පත් මණ්ඩලය, මැතිවරණ සමුපකාර සමිති හදබිම අධිකාරිය යනාදී ආයතන වේ.

- අනාවරණය වන කරුණු අනුව මෙම ඉඩම් වලින් වැඩි ප්‍රමාණයක් වැවිලි කලමනාකරණ සමාගම් වෙත දීර්ඝ කාලීන බදු වශයෙන් ලබා දී ඇති අතර, ඒ ස්ථාන වලට අයකරනු ලබන වාර්ෂික බදු මුදල අය කර ගනු ලබන්නේ මහා භාණ්ඩාගාරය විසින් ය. මෙයින් ගම්‍ය වන කරුණ වන්නේ අදාල ඉඩම් ඉහත ආයතන වලට බැහැර කළ පසු ඉඩමෙහි පූර්ණ අයිතිය ද ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පැනි සභාවෙන් බැහැර වී ඇති බවයි. මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් වෙතින් විමසා අවසාන තිරණයකට පැමිණිය යුතු බව විගණන හා කලමණාකරණ කමිටුව නිර්දේශ කරයි.

  මේ සම්බන්ධයෙන් ලේකම්තුමා හා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරි කටයුතු කරනු ඇත.

- අයකළ මුදල් තනතුර සඳහා බඳවා ගැනීම් පටිපාටිය වෙනස් කරන්නේද, වෙනස් කර අනුමැතිය ලබා ගන්නේ ද, වෙනත් විධිමත් අන්දමින් පුරප්පාඩුව සකස් කරන්නේ ද යන්න පිළිබඳව යෝජනා සහිත කොම්පැනි පත්‍රිකාවක් කොම්පැනි සභාවට ඉදිරිපත් කිරීමට [illegible]තුමිය වෙත උපදෙස් ලබා දෙන ලදී.

- මෙම [illegible] නිලධාරින් විසින් සම්මත කරන ලදී.

## 2014 10. 10 දින පැවති විගණන හා කළමණාකරණ කමිටුවේ ප්‍රගතිය

### කොම්පත් පත්‍රිකා අංක 01

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් විකුණුම් ආදායමින් 60% ක් මෙහෙයුම් වියදම් ලෙසද 40% ක් සංචිත ලෙසද වෙන් කිරිම සඳහා වූ කොමිෂන් සභා තීරණය පිළිබඳ ඉදිපත් කිරීම.

මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර. මෙම වෙන්කිරීම් වලට අදාළ කොමිෂන් සභාවේ තීරණය සොයා ගත නොහැකි බව අභ්‍යන්තර විගණක විසින් සඳහන් කරන ලදී. ඒ අනුව පසුගිය වර්ෂ 05 ක කාල සීමාව තුළදී ලැබූ සම්පූර්ණ විකුණුම් ආදායමෙන්. ඉන් 60% ක ප්‍රමාණයක් වෙන් වෙන්ව දක්වා ඊට සමානුපාතිකව ඒ ඒ වර්ෂය තුළ දැරූ සත්‍ය මෙහෙයුම් වියදම් ප්‍රමාණය දක්වා සවිස්තරාත්මකව කොමිෂන් පත්‍රිකාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට අධ්‍යක්ෂ/මුදල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### කොමිෂන් පත්‍රිකා අංක 02

දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්ත කර ඇති වාහන සඳහා ලබා දෙන ඉන්ධන ප්‍රමාණය හා වාහනය පාවිච්චි කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම

මෙය පරිපාලන තීරණයක් බව නිරීක්ෂණය වන අතර. මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කර හෝ නැතහොත් අධ්‍යක්ෂ ජනරාල්තුමිය විසින් අධීක්ෂණය කිරීමෙන් අනතුරුව තීරණයක් ගැනීමටත්. දැනට පවත්නා ක්‍රමයෙන් සැළකිය යුතු අන්දමින් බැහැර වන්නේ නම් සියලු කරුණු ඇතුලත් කර කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමටත්. කළමණාකරණ හා විගණන කමිටුව විසින් පෙන්වා දෙන ලදී.

කොමිෂන් පත්‍රිකා අංක 03

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කරන ලද නිලධාරීන් ණය ගෙවීම සම්බන්ධ අනුව ණය [illegible] නොගෙවා පැහැර හැර ඇති නිලධාරීන් සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම

මේ පිළිබඳ තීරණයක් ගැනීමට නම් නිලධාරීන් සේවයට බැඳුනු දිනය, ණය මුදල් ලබාගත් දිනය, ඇපකරුවන් සිටී නම් ඒ අයගේ නම්, හිග ණය මුදල, ණය අයකර ගැනීම සඳහා මෙතෙක් ගෙන ඇති පියවරයන් ආදී සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් විය යුතුය. අධ්‍යක්ෂ මුදල් විසින් සකස් කර ඇති 2014-06-24 දිනැති ලේඛණය පාලන අංශය වෙත යොමුකර අදාළ සියලුම විස්තර ලබාගත් සවිස්තරාත්මක ලේඛණයක් සකස් කරන ලෙසට අධ්‍යක්ෂ මුදල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## කොමිෂන් පත්‍රිකා අංක 04

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කටයුතු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම.

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන හා මාර්ගෝපදේශ සංග්‍රහයේ රෙගුලාසි වලට අනුව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරන ලෙසත්, ඒ ඒ ටෙන්ඩරයේ වටිනාකම අනුව බලතල පවරා ඇති පුද්ගලයන් විසින් තීරණය කළ පසුව ප්‍රසම්පාදන මණ්ඩලය ගන්නා තීරණය අවසාන තීරණයක් වන බවද, කෙසේ වෙතත් එම තීරණය කොමිෂන් සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.

## කොමිෂන් පත්‍රිකා අංක 05

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ ගෙවීම් සම්බන්ධ සාකච්ඡා කිරීම

(අ) [illegible] . ගමන් වියදම්. සාමාන්‍ය ගමන් වියදම්

[illegible] තීරණයකි. කෙසේ වෙතත් දැනට ඇති තත්වයේ විශාල වෙනසක් [illegible] කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සුදුසු ය.

## ...ම්පත් පත්‍රිකා අංක 06

කොමිෂන් සභාවට හා විගණන හා කළමනාකරණ කමිටුවට අදාලව විෂය භාර අමාත්‍යාංශය වන ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නියෝජිතයෙකු සහභාගී වීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

සියලුම විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම පිළිබඳ ජනාධිපති ලේකම් කාර්යාලය දැනුවත් කල යුතුය. නිරීක්ෂකයෙක් සහභාගී කරවීම අගය කරන බවද දන්වන අතර. ඒ සම්බන්ධයෙන් ලේකම්තුමා විසින් කටයුතු කල යුතුය.

මීලග කළමනාකරණ කමිටු රුස්වීම 2014. 12. 30 දින ප. ව. 2. 00 ට පැවැත්වීමට තීරණය විය.

| | |
|---|---|
| සභාපති, | ලේකම්, |
| විගණන හා කළමණාකරණ කමිටුව. | විගණන හා කළමණාකරණ කමිටුව. |

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 01 | එම්. ජේ. එස්. වීරසිංහ මහතා | සාමාජික | |
| 02 | එම්. අනෝමා නන්දනී මිය | සාමාජික | |
| 03 | එම් ආර්. ආර්. මල්ලව මිය | නිරීක්ෂක | |
| 04 | එච්. එම්. එස්. ජයතුංග මිය | අධ්‍යක්ෂ ජනරාල් | |
| 05 | ඊ. නරේන්ද්‍රනාදන් මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | |
| 06. | ශ්‍යාමලී රත්නායක මිය | අධ්‍යක්ෂ/මුදල් | |

# 2014 වසරේ 04 වැනි විගණන හා කළමනාකරණ රැස්වීම

ස්ථානය :- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

දිනය :- 2014. 12. 30 වන දින.

වේලාව :- ප. ව. 2. 30 - ප. ව. 1. 00

**කමිටු නිලධාරීන්ගේ සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| 01. | ඩී. ඩබ්ලිව්. සේනාරත්න මහතා | - සභාපති |
| 02. | එම්. ජී. එස්. වීරසිංහ මහතා | - සාමාජික |
| 03. | එම්. අනෝමා නන්දනී මිය | - සාමාජික |
| 04. | එම්. ආර් ආර් [illegible] මිය | - නිරීක්ෂක |

**ඉ. ප්‍ර. කො. සභාවේ නිලධාරීන්ගේ සහභාගීත්වය:-**

| | | |
|---|---|---|
| 05 | සෙනරත් [illegible] මයා | කමිටු ලේකම් (ලේකම්/අධ්‍යක්ෂ පාලන) |
| 06. | පී. නවරත්න [illegible] මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 07. | ශ්‍යාමලී [illegible] මිය | අධ්‍යක්ෂ/මුදල් |

ප්‍රථමයෙන් පසුගිය කළමනාකරණ කමිටුවේදී සාකච්ඡාවට බඳුන් වූ කරුණු පිළිබඳ ප්‍රගතිය කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 2014.08.25 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ ප්‍රගතිය

- **බදු ලේඛණය**

  දැනට බදු ලේඛණයේ නිරවද්‍යතාවය තහවුරු කරගෙන සම්පූර්ණ වාර්තාවක් ඉදිරි කමිටු වාරයට ආදායම් අංශයේ මාණ්ඩලික සහකාර වෙත අනිවාර්යයෙන් ඉදිරිපත් කිරීමට තීරණය විය. මේ පිළිබඳ සොයා බලා කටයුතු කිරීමට ලේකම්තුමාට උපදෙස් දෙන ලදී.

- **බැහැර කිරීමේ ලේඛණය**

  මෙම කරුණ පිළිබඳ මේ දක්වා ප්‍රගතිය ලේකම්තුමා හා අධ්‍යක්ෂ ජනරාල්තුමිය විසින් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී.

- **අධ්‍යක්ෂ/මුදල් තනතුර**

  මෙම කරුණ පිළිබඳව පසුගිය කොම්පන් සභා වාරයට කොම්පන් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මෙහිදී තීරණය වී ඇත්තේ මෙයට සමාන ආයතනවල අධ්‍යක්ෂ/මුදල් තනතුරේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමට කොම්පන් සභාවේ සත්කුමාර මහතාට පැවරූ අතර. ඒ පිළිබඳ වාර්තාව ලැබූ පසු ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

## 2014.10.10 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ ප්‍රගතිය

**පත්‍රිකා අංක 01**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පන් සභාවේ ඉඩම් විකුණුම් ආදායමින් 60% ක් මෙහෙයුම් වියදම් ලෙසද. 40% ක් සංචිත ලෙසද වෙන් කිරීම සඳහා වූ කොම්පන් සභා තීරණය පිළිබඳ ඉදිරිපත් කිරීම.

මෙම කරුණට අදාළ කොම්පන් සභා කෙටුම්පත අධ්‍යක්ෂ/මුදල්ට ඉදිරිපත් කළ අතර. ඒ අනුව කොම්පන් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී.

## පත්‍රිකා අංක 03

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කරන ලද නිලධාරීන්ට ණය යෝජනා ක්‍රමයට අනුව ණය (හෝ) ණය නොගෙවා පැහැර හැර ඇති නිලධාරීන් සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම.

අදාල ලේඛණය ඊළඟ කමිටු වාරයට ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ/මුදල් වෙත දන්වන ලදී.

## පත්‍රිකා අංක 06

කොමිෂන් සභාවට හා විගණන කළමනාකරණ කමිටුවට අදාලව විෂය භාර අමාත්‍යාංශය වන ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නියෝජිතයෙකු සහභාගී වීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

මේ පිළිබඳ ලිපියක් මගින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත දැන්වීමට ලේකම් වෙත දන්වන ලදී.

මෙම වාර්තාව කමිටු නිලධාරීන් විසින් සම්මත කරන ලදී.

## 2014.12.30 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ ප්‍රගතිය

## පත්‍රිකා අංක 01

### I. අම්පාර දිස්ත්‍රික් කාර්යාලය

අම්පාර කාර්යාලයේ 2010 වර්ෂයේ සිට අද දක්වා මූල්‍ය කටයුතු පිළිබඳ පරීක්ෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී.

මෙය මූල්‍ය වංචාවක් බවට කළමනාකරණ හා විගණන කමිටුව ප්‍රකාශ කරයි. ඒ අනුව නීත්‍යානුකූලව කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් දෙන ලදී.

II. කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය

මෙම කාර්යාලයේ ලිපිගොනු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ ලිපිගොනු අනුසාරයෙන් ලේඛණයක් සකස් කර දැනට කුරුණෑගල කාර්යාලයේ පවතින ලිපිගොනු පිළිබඳ සැසඳුම් වාර්තාවක් සකස් කර මීලඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර විගණකට උපදෙස් දෙන ලදී.

III. කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය

මේ පිළිබඳව කෑගල්ල දිස්ත්‍රික් අධ්‍යක්ෂගෙන් කරුණු විමසා ඇති බව සඳහන් වුවද, ඊට නියමිත කාලයක් තුළ පිළිතුරු ලබාගෙන විනයානුකූල පියවර ගත යුතු බව කමිටුව ප්‍රකාශ කරයි.

එසේම ප්‍රගතිය ඊළඟ කමිටුවට වාර්තා කල යුතු බවට ලේකම්තුමාට උපදෙස් දෙන ලදී.

2015 වර්ෂයේදී සියලුම දිස්ත්‍රික් කාර්යාල විගණනය කළ යුතු බවත්. විගණනය කරන දිස්ත්‍රික් කාර්යාලවල වාර්තා විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ යුතු බවත්. තීරණය විය.

පත්‍රිකා අංක 02

**2014 වර්ෂයේ ඉදිරි වැඩ සටහන , 2014 වර්ෂයේ ප්‍රගතිය, 2015 වර්ෂයේ ඉදිරි වැඩ සටහන**

අභ්‍යන්තර විගණන වැඩසටහන සාකච්ඡා කරන අවස්ථාවේ විගණන අධිකාරීතුමිය විසින් පවසා සිටියේ දැනට කොමිෂන් සභාවේ ගිණුම්කරණ කටයුතු කරනු ලබන්නේ සම්ප්‍රදායික (MANUAL) ක්‍රමය මත බවත්. ඒ සඳහා මෘදුකාංගයක් හඳුන්වා දිය යුතු බවටත් නිර්දේශ කරන ලදී. මෙය කළමනාකරණ කමිටුව මගින්ද අනුමත කරන ලදී.

2015 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන අධ්‍යයනයෙන් පසු පෙනී ගිය කරුණක් වන්නේ ඉදිරිපත් කර ඇති වැඩ සටහන 100% ක් නිම කළ හැකි නම් එහි ප්‍රගතියක් ලගා කර ගත හැකි බවයි.

නමුත් 2014 නිම කිරීමට හැකි වූයේ 75% ක් පමණි. ඒ අනුව පළමු කාර්තුවේ ප්‍රගතිය ඊළඟ කමිටුවට වාර්තා කළ යුතු බවයි.

[illegible] අභ්‍යන්තර විගණන වැඩ සටහන [illegible]
[illegible] කරයි.

පත්‍රිකා අංක 03

## 2015 - 2019 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාත්මක සැලැස්ම- 2015

2015 - 2019 සඳහා වූ සංයුක්ත සැලසුම අධ්‍යයනය කල කළමනාකරණ කමිටුව අදාළ කාල පරිච්ඡේදය තුළදී සිදු කිරීමට අපේක්ෂිත මූලික කාර්යයන්වල උපලේඛණයක් ඇතුලත් සැලැස්මක් උපාය මාර්ග සැලසුමට පෙර සංයුක්ත සැපසුමට ඇතුලත් කර ගත යුතු බව තීරණය කරන ලදි.

එම කරුණු ඇතුලත් කිරීමෙන් පසුව කොම්පත් සභාවට ඉදිරිපත් කල යුතු බව තීරණය කරන ලදි.

මෙම කරුණ පිළිබඳ වැඩිදුර උපදෙස් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ අනෝමා නන්දනී මහත්මියගෙන් ලබා ගත යුතු බව ලේකම්තුමා වෙත දන්වන ලදි.

මීලග කළමනාකරණ කමිටු රැස්වීම 2015. 02. 24 දින ප. ව. 2. 00 ට පැවැත්වීමට තීරණය විය.

සභාපති.
විගණන හා කළමණාකරණ කමිටුව.

ලේකම්.
විගණන හා කළමණාකරණ කමිටුව.

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 01 | එම්. ජ්. එස්. වීරසිංහ මහතා - | සාමාජික | |
| 02 | එම්. අනෝමා නන්දනී මිය - | සාමාජික | |
| 03 | එම්. ආර්. ආර්. ලේලව මිය | නිරීක්ෂක | |
| 04 | ටී. නරේන්ද්‍රනාදන් මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | |
| 05 | ශ්‍යාමලී රත්නායක මිය | අධ්‍යක්ෂ/මුදල් | |